2026.06.14 ඉරිදා | හත්වැනි කාණ්ඩය | 47 වැනි කලාපය
දැන් ඉරිදා

# මව්රට

රු.100



යූඇන්පීය සහ සජබය
**අනුරට පින් දිය යුත්තේ ඇයි?**
P » 04



ජනාධිපතිවරු
# 3යි

# ළඟදීම කොටුවෙයි

මැති ඇමැතිවරු
# 19යි

මාලිමා රජය බලයට පත්වීමෙන් පසුව ආරම්භ කොට ඇති විමර්ශන සහ ඉදිරියේදී නඩු ගොනුවිය හැකි හිටපු සහ තවමත් දේශපාලනයේ නියුතු මැති ඇමැතිවරුන් සම්බන්ධයෙන් අතිවිශේෂ හෙළිදරව්වක් මෙවර 'මව්රට' පුවත්පතේ පළවේ.
P » 02

මෙන්න ලැයිස්තුව

අතිවිශේෂ හෙළිදරව්ව

## කෑම හිඟයක් ගංවතුරක් මහා නියඟයක්

# ලංකාවට භයානක අනතුරක්

P » 02

සජිත් කලින්ම කියයි

අනුර වහාම සූදානම් වෙයි



## මාලිමාව ඉවරයි ජවිපෙ ඉස්සෙයි

P » 02

## පොදු අපේක්ෂකයෝ අතුරුදන් වෙයි

2029 ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයන් ලෙස තරග වැදීමට සූදානමින් සිටින විපක්ෂයේ දේශපාලන නියෝජිතයන් කිහිප දෙනෙක් සම්බන්ධයෙන් පසුගිය සතියේ 'මව්රට' කළ අනාවරණයත් සමග මේ වනවිට එම ජනාධිපති අපේක්ෂකයන් හදිසියේම අතුරුදන් වී ඇති ආකාරයක් දැකගන්නට තිබේ.
P » 02

1999 පරාදයි
2005 පරාදයි
2024 තුන්වැනියා


## වයස 80දී රනිල් ආයෙත්

ජනාධිපති සටනට
P » 02

## කොළඹ-නුවර-අනුරාධපුර-කතරගම සිංගප්පූරුවක් කරන්න හදයි

ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර කිහිපයක් වන කොළඹ, මහනුවර, අනුරාධපුරය සහ කතරගම ඩුබායි, සිංගප්පූරුව, පැරිස්, මෙල්බර්න් වැනි නගර මෙන් ජාත්‍යන්තර මට්ටමේ සන්නාම නගර (Brand Cities) බවට පත්කිරීමේ සංවර්ධන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව තීරණය කොට ඇත.
P » 02


රටම එක් කරන සබැඳියාවට,
උපහාර



රටේ හැම මොහොතකම,
රටම එක් කරන
රාජ්‍ය සේවක සහ විශ්‍රාමික
ඔබ වෙනුවෙන්ම දැන්,

උපහාර 499/-
මාසිකව රු.499/- (බදු රහිතව)
15GB ANYTIME DATA
ඕනෑම ජාලයකට මිනිත්තු 1000 + SMS 1000
10GB DATA for
7.5GB DATA for

උපහාර 727/-
මාසිකව රු.727/- (බදු රහිතව)
30GB ANYTIME DATA
ඕනෑම ජාලයකට මිනිත්තු 1000 + SMS 1000
10GB DATA for
7.5GB DATA for

40%ක් මූලිකව ගෙවා SMART PHONE එකක් ඔබේම කරගන්න
ඉතිරිය සමාන වාරික 12කින් ගෙවන්න.

MOBITEL
*Terms & Conditions Apply
TRC/M/PER/26/01

හැමෝම බණිනවා බණිනවා ඉවරයක් නෑ...

# සෙනෙහසේ කැදැල්ල ගැන පසුවිපරමක්

**දරුවෙකුගේ ජීවිතයේ පළමු වචනය, පළමු පියවර, පළමු සිහිනය හැඩගස්වන්නේ මවුපියන්. තමන්ගේ මුළු ජීවිතයම දරුවන් වෙනුවෙන් ජීවත් වූ ඒ මවුපියන් වයසට ගිය පසු ඔවුන් සිය අවසන් කාලය සතුටෙන් සැනසීමෙන් සහ ආදරයෙන් ගෙවිය යුතුයි. ඒත් හොරණ අඟුරුවාතොට බටගොඩ ප්‍රදේශයේ පිහිටි 'සෙනෙහසේ කැදැල්ල' වැඩිහිටි නිවාසයේ පසුගියදා සිදුවූ ඛේදවාචකය මුළු රටම සසල කළ සිදුවීමක් බවට පත්වුණා.**

තමන්ගේ දරුවන්ගෙන් අහිමි වූ උණුසුම, රැකවරණය සොයා එහි ආ වැඩිහිටියන් පිරිසකට අවසානයේ උරුම වුණේ ගිනිදැල්. ජීවිතයේ අවසන් කාලය නිහඬව නිදහසේ ගතකිරීමට බලාපොරොත්තු වූ මිනිසුන් 13 දෙනකුගේ ජීවිත එහිදී මිනිත්තු කිහිපයකින් නිමාවට පත්වුණා. තවත් පිරිසක් ජීවිතයත් මරණයත් අතර සටනක නිරත වෙමින් මේ වනවිටත් රෝහලේ ඇඳන් මත වේදනා විඳිනවා.

මේ ඛේදවාචකය ගැන විවිධ අය විවිධ චෝදනා එල්ල කරන්නට වුණා. සමහරු කිව්වා සේවිකාව ගේට්ටුවල අගුළු දමා ගිය නිසා ජීවිත බේරාගන්න බැරි වුණා කියලා. තවත් සමහරු කිව්වා දම්වැල් දාලා බැඳලා තිබුණු නිසා බේරාගන්න බැරිවුණා කියලා. ඒ වගේම මේ වැඩිහිටි නිවාසයේ ආරක්ෂාව ගැනත් බොහෝ විවේචන එල්ල වුණා. මේ ආයතනය රජයේ ලියාපදිංචිය ලබාගෙන නැති බවද බලධාරීන් පවසා තිබුණා.

'සෙනෙහසේ කැදැල්ල' වැඩිහිටි නිවාසයේ පාලිකාව ඉන්ද්‍රානි ඒකනායක මෙම අනතුර සම්බන්ධයෙන් අදහස් දක්වා තිබුණේ මෙලෙසයි.

'මේ අනතුර සිදුවන අවස්ථාවේ මමවත් ආයතන ප්‍රධානියාවත් හිටියේ නැහැ. හේතුව මීට කලින් සිදුවුණු මරණයක කටඋත්තර දෙන්න පොලිසියට ගිහින් හිටියේ. මම අපේ නේවාසිකයන්ට අවශ්‍ය බෙහෙත් ගන්න එළියට ගිහින් හිටියේ. මේ වෙලාවේ හිටියේ සේවකයන් දෙදෙනකු විතරයි. අපිට කෝල් එකක් ඇවිත් අපි එතැනට එනවිට ආයතනයට එන්නට බැරි තරමට එතැන ගිනිගොඩක් බවට පත්වෙලා. 2024 තමයි මේක පටන් ගන්නේ. අපි මේ ආයතනය මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දාලා ලියාපදිංචි කරන්න උත්සාහ දැරුවා. 2025ත් ලිපි ඉදිරිපත් කරලා නිලධාරින් ඇවිත් සටහන් පොතේ සටහන් තබා ගිහින් තියෙනවා. අපිට උපදෙස් ලැබුණා. වැඩිහිටියන් 31කට වැඩි පිරිසක් හිටියා අනේ අපිව බලාගන්න කියලා ආව අය. මෙතැන ඉන්නේ මානසික ආබාධ සහිත විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්. එයාලා පාලනය කරන්න හරිම දුෂ්කරයි. අපි විතරක් දම්වැල් දාලා කියන්න බැහැ. අංගොඩ රෝහලට ගියොත් එයාලාත් දම්වැල් දාලා තියෙනවා. එකම කෙනෙක් විතරයි මානසික ආබාධයක් නිසා දම්වැල් දාලා හිටියේ. ප්‍රදාන විදියට ලැබුණු මෙට්ට 80ක් තිබුණා. ඒවා තමයි ගිනි අරගෙන තිබුණේ. කරන්ට් එක ලීක් වෙලා කියලා තමයි කියන්නේ. තාමත් මට හිතාගන්න බැහැ මොනවාද වුණේ කියලා....'

ග්‍රාමීය සංවර්ධන, ප්‍රජා සංවර්ධන සහ සවිබල ගැන්වීමේ අමාත්‍ය ආචාර්ය උපාලි පන්නිලගේ මහතා පැවැසුවේ මේ ආයතනය ලියාපදිංචි කර නොමැති බවත්, ලියාපදිංචි නොකළ වැඩිහිටි නිවාසවලට එරෙහිව දැඩි නීතිමය පියවර ගන්නා බවයි.

මේ නිවාසය ගැන බොහෝ චෝදනා එල්ල වී ඇති බවයි අවට සිටින්නන් පවසන්නේ. පසුගිය 03 වැනිදා මේ නිවාසයේ සාත්තු සේවා කටයුතු කර තිබුණේ සඳමාලි නමැති කාන්තාවක් සහ ඇගේ ස්වාමිපුරුෂයා වන චතුරංග නමැත්තායි. මේ නිවාසේ හිමිකරු වුණේ ඉසුරු නමැති පුද්ගලයෙකි.

සඳමාලිගේ ස්වාමිපුරුෂයා වන චතුරංග පැවැසුවේ මෙවැනි දෙයකි.

'දවල් දානේ අරගෙන ආපු කට්ටිය දානේ දීලා එළියට වෙලා වාඩිවෙලා හිටියා. අපිත් කට්ටියත් එක්ක විහිළු කර කර ඉන්න ගමන් සවස 5.10ට විතර වැහි පොද වැටෙන්න ගත්තා. මම එතකොට කෑගැහුවා කට්ටියට පිරිමි අයට කිව්වා ඇතුළට යන්න කියලා. මගේ වයිෆ්ට කිව්වා ගෑනු කට්ටිය ඇතුළට දාන්න කියලා. රෑට කන්න දෙන්න ඕනේ නිසා කුස්සියට ගියා උයන්න. මේ නිවාසයේ වැඩිහිටි අය වැඩි හරියක් කියන දේ අහන්නේ නැහැ. වැටෙන් පැනලා හරි යනවා. කුස්සියට ගිහින් හාල් ටික ළිපේ තිබ්බා විතරයි දයාසීලි කෑගැහුවා ගිනි ගන්නවා කියලා. ගින්නක් ගින්නක් කියලා කෑගහද්දි මම එළියට පැනලා කුස්සියෙන්ම ඉස්සරහ පැත්තට යන්න පුළුවන් දොර ඇරගෙන ගෑනු පැත්තට යන්න යනකොට මම දැක්කා මෙට්ටවලින් ගින්දර යනවා. මෙට්ට 80ක් විතර තිබුණා. මම ට්‍රිප් ස්විච් එක නිවලා මෙට්ට ටික නිවන්න දිව්වා. මම දුවන කොට ගොඩක් ගිනි ඇවිලිලා ඉවරයි. පිටිපස්සේ හිටපු පිරිමි කට්ටිය දැම්මා බාත්රූම් එකට. ටික දෙනෙක් ඉස්සරහට අරන් එළියට බැස්සා. පස්සේ ගෑනු පැත්තට දිව්වා. දුවනකොට මගේ වයිෆ් ටික දෙනෙක් එළියට අරගෙන. මම 4 දෙනෙක් ගෑනු කට්ටිය ගත්තා එළියට. එයින් දෙන්නෙක් හොස්පිට්ල් යවන්න සිද්ධ වුණා. මම අතට ගන්නකොට මස් ගැලවිලා එනවා. ඒ පිලිස්සිලා නිසා.

ඔහුගේ බිරිඳ සඳමාලි කිව්වේ මෙවැනි කතාවක්...

'මමත් ගෑනු ළමයෙක්ව එළියට ගත්තා. ගිනිගන්න කාමරේට ගිහින් ජනෙල් රෙද්දේ ඔතාගෙන තමයි මම එළියට ආවේ. මමත් ගත්තා පස් හය දෙනෙක් එළියට. පස්සේ ගමේ කට්ටිය ඇවිත් මට කිව්වා ඔයා ගෑනු කෙනෙක්නේ ඔයාට බෑනේ මෙයාලා ගන්න ඔයා ගේට්ටුව ළඟ ඉන්න, අපි අනිත් අයව ගන්නම් කියලා. ඒ අනිත් අය පැනලා යයි නිසයි. දම්වැල දාලා හිටපු කෙනා තමයි බේරාගන්න බැරිවුණේ. එයාගේ කකුලේ ලොකු තුවාලයක් තිබුණා. ඒක නිසා තමයි දම්වැල් දැම්මේ එයාගේ ආරක්ෂාවටමයි. මෙයාලාව කවදාවත් බඩගින්නේ තියලා නැහැ. සර් අතින් හරි වියදම් කරලා චූන් පාන් අරන් දෙනවා. ගේට්ටුව ළඟට ඇවිත් කට්ටිය මැරුණා කියලා ඇඬුවා. ඒත් අපි කවදාවත් දැකලා නැහැ ඒ අය ඇවිල්ලා බලන් ඉන්නවා. පරුෂ වචන කියන නිසා තමයි ගමේ කට්ටිය මෙයාලාට අකැමැති. සමාජ මාධ්‍යයේ කියලා තිබුණා රන් මාලයක් ගන්න ඇවිත් කෙනෙක් නැති වුණා කියලා. එහෙම දෙයක් වුණේ නැහැ. එදා දානයක් දෙන්න ආව අය පබළු මාල නම් දීලා තිබුණා කට්ටියට. ඊට අමතරව වෙන රන් ආභරණ නම් තිබුණේ නැහැ. සමහරු මට චෝදනා කරලා තිබුණා සඳමාලි ගේට්ටුව වැහුව නිසයි එළියට යන්න බැරිවුණේ කියලා. අපි උයන්න යනකොට යකඩ දොර වහනවා. කුරුළු කියන්නේ අපේ නිවාසේ පාලිකාව.'



නිලන්ති රේණුකා

බොහොමයක් මේ නිවාසේ සිටියේ මානසික ආබාධ සහිත වයසක පුද්ගලයින්. ගොඩාක් අය කිව්වේ දම්වැල් දාලා නිසා මේ අය මියගියා කියලා. මොවුන් නම් පැවැසුවේ එක් අයකු පමණයි එසේ දම්වැල් දාලා සිටියේ කියා. මේ දෙදෙනා බොහෝ දෙනෙකු බේරගනු ලැබුවේ ගින්දර මැදින් ගොසිනි. සමහරු නම් චෝදනා කළේ 70ක් දාන්න බැහැ මේ වැඩිහිටි නිවාසේ කියලයි. නමුත් සඳමාලි නම් කිව්වේ හිටපු අය සතුටෙන් පුළුවන් විදියට හිටිය බවයි. ඇතුළත් වීමේ ගාස්තු වශයෙන් හැත්තෑ පන්දහක් ගන්නවා. මෙහි හිමිකරු විසින් බොහෝ වැඩිහිටියන් මේ නිවාසයට ගෙනත් තියෙන්නේ පාරේ සිටින විටදියි.

මේ වැඩිහිටි නිවාසයට නළු නිළියන් ගෙන්වා ගනිමින් ටික්ටොක් වීඩියෝ කරමින් මේ නිවාසය ප්‍රසිද්ධියට පත්කර ඇති බවටද චෝදනා නැගුණා. ගමේ බොහෝ අය මේ නිවාසයට චෝදනා නගන්නේ මානසික ආබාධ සහිත පුද්ගලයන් කෑගසන නිසා බවයි මෙහි සේවකයන් පවසන්නේ. මේ වගේ වැඩිහිටි නිවාසයක් බලාගැනීම ලේසි පහසු කාර්යයක් නෙවෙයි. දරුවන්ට මවුපියන් බලාගන්න බැරිකොට පිට කෙනකු මේ කාර්යය කරනකොට සුළු සුළු වැරදි වන්නට පුළුවන්. මේ වැඩිහිටි නිවාසයට අමතරව තවත් නිවාස 2ක් ගලපාත සහ සේරුපිල යන ස්ථානවල පිහිටලා තියෙනවා. අද වනවිට මෙහි හිමිකරු අත්අඩංගුවට ගෙන තිබෙනවා. නමුත් රජයේ ආයතනයක් විසින් ඉටුකළ යුතුව තිබූ සේවයක් තමයි මෙහි හිමිකරු විසින් සිදුකරමින් තිබුණේ.

පොලිසිය අධිකරණ ඉදිරියේ පවසා තිබුණේ මේ වැඩිහිටි නිවාසයේ ගිනි නිවන උපකරණ හෝ ආරක්ෂක තාප්පයක් මෙන්ම හදිසි අවස්ථාවක ජලය ලබාගැනීමේ පහසුකම් සපයා නොමැති බවයි. මේ ආයතනයේ හිමිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා පවසා තිබුණේ දරුවන්ගේ රැකවරණය නොමැති බොහෝ මවුපියන් පිරිසකට මේ ආයතනය විසින් රැකවරණ සපයා දුන් බවයි. කෙසේ වෙතත් ඉදිරිපත් වූ කරුණු අනුව හොරණ මහෙස්ත්‍රාත් ලක්මිණි විදානගමගේ මහත්මිය නියෝග කළේ වැඩිහිටි නිවාසයේ හිමිකරුව ජූනි 11 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමටයි.

මේ අහිංසක මවුපියන්ගේ අවසාන මොහොතේ හදවතේ තියෙන්නට ඇති අපේ දරුවෝ ඇවිත් අපිව බේරගනීවි කියලා. නමුත් ඔවුන්ට අවසානයේ හිටියේ බොහෝ ජීවිත බේරාගත් සඳමාලි සහ චතුරංග විතරයි. ඔවුන් කළ ඒ සේවයට හිස නමා ආචාර කළ යුතුයි.

එහෙත් නැගෙන සියලු චෝදනාවලට වඩා අප අපෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය වන්නේ තමන්ගේ දරුවන් වෙනුවෙන් ජීවිතයම කැප කළ මේ මවුපියන්ගේ අවසානය මෙලෙස විය යුතුද යන්නයි.

සෙනෙහස සොයා ආ ජීවිතවල අවසානය ගිනිදැල් අතරින් නිමාවට පත්වී මේ වැඩිහිටියන්ට සමාජයෙන් අත්වූ ඉරණම ඛේදවාචකයක් බවට පත්වී ඇත. මෙවැනි අනුවේදනීය ඉරණමක් මවකට පියෙකුට තබා කිසිම මනුෂ්‍යයෙකුට අත් නොවේවා යන්න අද මුළු රටම ප්‍රාර්ථනා කරන්නේ එබැවිනි.




PAGE - 01

## අතිවිශේෂ හෙළිදරව්ව...

ඒ අනුව, මේ වනවිට හිටපු ජනාධිපතිවරුන් තිදෙනකු සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ වී ඇති අතර, හිටපු මැති ඇමැතිවරුන් 19 දෙනකු සම්බන්ධයෙන් විවිධ චෝදනා යටතේ විමර්ශන නිලධාරීන් විසින් පරීක්ෂණ ආරම්භ කර තිබේ.

ඒ පිළිබඳ සියලු විස්තර 08 වැනි පිටුවේ පළවේ.

## අනුර සූදානම් වෙයි...

ලොව පුරා උෂ්ණත්වය ඉහළ නැංවීමට සහ දරුණු මට්ටමේ කාලගුණික තත්ත්වයක් ඇති කිරීමට බලපාන ප්‍රධාන ස්වභාවික සංසිද්ධියක් වන එල්-නිනෝ තත්ත්වය මේ වන විට නිල වශයෙන් ආරම්භ වී ඇති බවත්, ඉන් ඉතා දරුණු ආකාරයට ශ්‍රී ලංකාවටද බලපෑම් එල්ල කරනු ඇති බවත් මාධ්‍ය වාර්තා පළකොට ඇත.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ජාතික සාගර හා වායුගෝලීය පරිපාලන ආයතනය නිවේදනය කර ඇත්තේ, මධ්‍යම සහ නැගෙනහිර සමකාසන්න පැසිෆික් සාගර කලාපයේ මුහුදු මතුපිට උෂ්ණත්වය සාමාන්‍ය අගයට වඩා සෙල්සියස් අංශක 0.5කින් ඉහළ ගොස් ඇති අතර, එය එල්-නිනෝ තත්ත්වයක් ලෙස සැලකීමට අවශ්‍ය සීමාව ඉක්මවා ඇති බවය.

විද්‍යාඥයන් පෙන්වා දෙන්නේ මෙවර එල්-නිනෝ තත්ත්වය ඉතා ප්‍රබල හෙවත් 'දරුණු එල්-නිනෝ' තත්ත්වයක් දක්වා වර්ධනය වීමේ හැකියාවක් පවතින බවත්, එය ඉතිහාසයේ වාර්තා වූ ප්‍රබලතම එල්-නිනෝ සංසිද්ධීන් අතරට එක්විය හැකි බවත් විද්‍යාඥයන් අනාවැකි පළකොට තිබේ.

මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දශක ගණනාවක් තිස්සේ සිදුවන ගෝලීය උණුසුම් වීමට අමතරව මෙම තත්ත්වයද එකතු වීම නිසා, ඉදිරි වසරක කාලය (බොහෝ දුරට 2027 වසර) වාර්තාගත ලෙස උණුසුම් අධික වසරක් බවට පත්විය හැකි බව විශේෂඥයෝ පෙන්වා දෙති.

ඒ අනුව මෙම එල්-නිනෝ තත්ත්වය ශක්තිමත් වුවහොත් ශ්‍රී ලංකාවට ඉන් ඇතිවිය හැකි බලපෑම් මාසිකව බැලුවහොත් මෙවැනි රටාවක් බලාපොරොත්තු විය හැකිය.

ශ්‍රී ලංකා කාලගුණ දෙපාර්තමේන්තුවේ මෑත අනාවැකි අනුව එල්-නිනෝ තත්ත්වය මේ වනවිට වර්ධනය වෙමින් පවතින අතර 2026 අග හා 2027 මුලදී උපරිමයට පැමිණිය හැක.

ජූලි - අගෝස්තු
- උෂ්ණත්වයෙන් වැඩිම බලපෑම
- සාමාන්‍යයට වඩා උණුසුම් කාලගුණය
- නිරිතදිග මෝසම් වැසි අඩුවීම
- ජලාශ මට්ටම් පහත වැටීම
- ජල විදුලි නිෂ්පාදනයට පීඩනය

සැප්තැම්බර්
- වියළි හා උණුසුම් කාලයක්
- ගොවිතැනට ජල හිඟ වීමේ ගැටලු
- වියළි කලාපවල පානීය ජල පීඩනය
- විදුලි ඉල්ලුම ඉහළ යාම

වැඩිම අවදානමක් සහිත ඔක්තෝබර් - දෙසැම්බර් කාලය
- අධික වැසි
- හදිසි ගංවතුර
- නායයෑම්
- නාගරික ජල ගැලීම්
- ඩෙංගු ව්‍යාප්තිය

ආර්ථික බලපෑම් ආරම්භ වන 2027 ජනවාරි - මාර්තු
- සහල් මිල ඉහළ යා හැක
- එළවළු මිල ඉහළ යා හැක
- තේ හා රබර් නිෂ්පාදනයේ වෙනස්කම්
- ආහාර උද්ධමනය

ලෝක ආහාර නිෂ්පාදනයටද එල්-නිනෝවේ බලපෑම් ඇති බැවින් ශ්‍රී ලංකාවේත් ආනයනික ආහාර හා ඉන්ධන පිරිවැය හරහා පීඩනයක් එල්ල විය හැක.

2027 මුල් භාගයේ විශේෂ අවදානම්

- ජල හිඟය
- ආහාර මිල ඉහළ යාම
- ගංවතුර හා නායයෑම්
- ඩෙංගු වැඩිවීම
- විදුලිබල පීඩනය

කෙසේ වෙතත් ලබන ජූලි - අගෝස්තු මාසවලදී මේ ආකාරයේ බරපතළ කාලගුණික විපර්යාසයන් සිදුවිය හැකි එල්-නිනෝ තත්ත්වයකට ලංකාවට මුහුණ දීමට සිදුවිය හැකි බව පළමු වරට රටට අනාවරණ කළේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාය.

පාර්ලිමේන්තුවේදී අදහස් දක්වමින් විපක්ෂ නායකවරයා පෙන්වා දුන්නේ වහාම මෙහි බලපෑම ජනතාවට දැනීම අවම කිරීම සඳහා ආණ්ඩුව පියවර ගත යුතු බවකි.

කෙසේ වෙතත් එල්-නිනෝ බලපෑම සහ ඊට මුහුණ දීමේ සැලසුම පිළිබඳ සොයාබැලීමේ විශේෂ සාකච්ඡාවක් පසුගිය බ්‍රහස්පතින්දා (11) දිනයේදී ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී පැවැත්විණි. මෙහිදී ඉදිරියේදී ඇතිවිය හැකි එල්-නිනෝ තත්ත්වය හරහා මෙරට ආහාර සුරක්ෂිතතාව, පානීය ජලය සහ බලශක්ති යන ක්ෂේත්‍ර කෙරෙහි ඇතිකරන බලපෑම සහ එකී ක්ෂේත්‍ර කළමනාකරණය කරගැනීම සඳහා ගතයුතු කඩිනම් පියවර පිළිබඳවද පුළුල් ලෙස විමසා බලා තිබිණි.

## රනිල් ජනාධිපති සටනට...

2029 වසරේ පැවැත්වෙන ජනාධිපතිවරණයට අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමට එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා සූදානමින් සිටින බව එම පක්ෂ අභ්‍යන්තර ආරංචි මාර්ග සඳහන් කරයි.

පසුගිය බ්‍රහස්පතින්දා (11) පැවැති එජාප කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමෙන් අනතුරුව මාධ්‍ය හමුවේ අදහස් දැක්වූ කිහිප දෙනෙක්ම මේ බව තහවුරු කරමින් කියා සිටියේ රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති ධුරය භාරගැනීමට මේ වනවිට සූදානමින් සිටින බවකි.

කෙසේ වෙතත් මෙහි ඇති විශේෂත්වය වන්නේ ලබන 2029 වසර වනවිට රනිල් වික්‍රමසිංහ මහතාගේ වයස අවුරුදු 80 ඉක්මවා තිබීමය.

එමෙන්ම දැනට ඒ මහතා සිටින්නේද විවෘත හෘදය සැත්කමකට භාජනය වීය.

කෙසේ වෙතත් රනිල් වික්‍රමසිංහ මහතා පළමු වරට ජනාධිපතිවරණයකට ඉදිරිපත් වූයේ 1999 වසරේදීය. ඉන් ඒ මහතා චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය හමුවේ පරාජයට පත්විය.

ඉන් අනතුරුව නැවත වතාවක් 2005 වසරේ ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ රනිල් වික්‍රමසිංහ මහතා මහින්ද රාජපක්ෂ මහතා හමුවේද පරාජයට පත්විය. ඒ අවස්ථා දෙකේදීම රනිල් වික්‍රමසිංහ මහතා තරග වැදුණේ විපක්ෂ නායකවරයා වශයෙනි.

කෙසේ වෙතත් 2024 වසරේ රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිවරයා වශයෙන් සිටියදීම ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ නමුත් එහිදීද ඔහු පරාජයට පත්වූයේ තුන්වැනි ස්ථානයට ඇදවැටී වාර්තාවක්ද තබමිනි.

## පොදු අපේක්ෂකයෝ..

අප පසුගිය සතියේදී අනාවරණ කළේ සමාජ මාධ්‍ය ඔස්සේ තමන් ජනාධිපතිවරණයට ඉදිරිපත් වන බවට නිල මෙන්ම නොනිල ප්‍රකාශ කරමින් පාඨලී චම්පික රණවක, හර්ෂ ද සිල්වා, මහාචාර්ය ජී.එල්. පීරිස්, විමල් වීරවංශ, දිලිත් ජයවීර, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා යන මහත්වරුන් විවිධාකාරයේ ප්‍රචාරක මෙහෙයුම් ආරම්භ කර ඇති බවය.

මේ පිරිස අතරින් පාඨලී චම්පික රණවක, දිලිත් ජයවීර, ජී.එල්. පීරිස්, ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා, විමල් වීරවංශ ආදීන් දැනටමත් සිය ප්‍රචාරක ව්‍යාපාරය ආරම්භ කරමින් සාකච්ඡා, මාධ්‍ය හමු සහ සම්මන්ත්‍රණවලට සහභාගි වන ආකාරයක්ද අප වාර්තා කළෙමු.

කෙසේ වෙතත් පසුගිය සතියේ අප කළ අනාවරණයත් සමග මෙම ජනාධිපති අපේක්ෂකයන් සියලු දෙනාම තමන් විසින් සමාජ මාධ්‍යවල ගෙනගිය ප්‍රචාරක ව්‍යාපාරයන් නවත්වා ඇති ආකාරයක් දැකගන්නට තිබේ.

කෙසේ වෙතත් අපට ඇති තොරතුරුවලින් නම් කියැවෙන්නේ 2029 ජනාධිපතිවරණයද 2024 ජනාධිපතිවරණය මෙන් තුන්කොන් සටනක් වනු ඇති බවකි. ඒ අනුව ඊට මාලිමාව නියෝජනය කරමින් නැවත වතාවක් අනුර කුමාර දිසානායක මහතාත්, සමගි ජන බලවේගය නියෝජනය කරමින් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාත්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරමින් නාමල් රාජපක්ෂ මහතාත් 2029 ජනාධිපතිවරණයට තරග වැදීමට නියමිතව ඇති බවකි.

## කොළඹ නුවර...

මූලික වශයෙන් මෙහි අරමුණ වී ඇත්තේ ඩුබායි, සිංගප්පූරුව හෝ පැරිස් වැනි ලෝක ප්‍රසිද්ධ නගරවලට සමාන පහසුකම් හා ආර්ථික පරිවර්තනයන් මෙරට තුළද ඇති කිරීමය.

මෙහිදී එම නගර කේන්ද්‍ර කරගනිමින් පහත දැක්වෙන සංකල්ප ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත.

කොළඹ - ජාත්‍යන්තර මූල්‍ය, ව්‍යාපාරික හා නවීන තාක්ෂණික කේන්ද්‍රස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීමට නියමිත අතර, මහනුවර - සංස්කෘතික හා උරුමයන් සුරකෙන නාගරික සංචාරක නගරයක් බවට පත්කිරීමට නියමිතය.

එමෙන්ම අනුරාධපුරය හා කතරගම - ඓතිහාසික හා ආගමික වටිනාකම්වලට හානියක් නොවන පරිදි, අතිනවීන සංචාරක යටිතල පහසුකම් සහිත ආගමික සංචාරක නගර ලෙස සංවර්ධනය කිරීමට යෝජනා වී තිබේ.

මෙම වැඩපිළිවෙළ හරහා දේශීය මෙන්ම විදේශීය ආයෝජන ආකර්ෂණය කරගැනීම සහ ශ්‍රී ලංකාව ආසියානු කලාපයේ ප්‍රධාන ආර්ථික කේන්ද්‍රස්ථානයක් කිරීම ආණ්ඩුවේ අපේක්ෂාව වී ඇත.

## මාලිමාව ඉවරයි...

මේ වනවිට ජාතික ජන බලවේගය නොහොත් මාලිමාව නමැති පුළුල් පෙරමුණ පහතට ඇද දමා ජනතා විමුක්ති පෙරමුණ බලය අත්පත් කරගනිමින් සිටින බව මාලිමාවේ න්‍යායාචාර්ය මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා පෙන්වා දෙයි.

මාධ්‍ය හමුවකට එක්වෙමින් ඒ මහතා සඳහන් කළේ ආණ්ඩුකරණය යනු පුළුල් විෂයක් වුවද, ආණ්ඩුව එය අභියෝගයක් ලෙස භාරගන්නවා වෙනුවට සුළුකොට තකමින් කටයුතු කරමින් සිටින ආකාරයක් දැකගන්නට ඇති බවය.

එම නිසා ඉදිරියේදී තමන්ටද ආණ්ඩුව සම්බන්ධයෙන් විවේචනාත්මක ස්ථාවරයකට යොමුවනවා හැරෙන්න වෙනත් විකල්පයක් නොමැති බවද නිර්මාල් රංජිත් දේවසිරි මහතා කියා සිටියේය.



# ඉන්දීය මහකොමසාරිස් ඩෙල්ෆ්ට්වලට ගිහින් අවුළුවපු අලුත් ගින්න

**ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් සන්තෝෂ් ජා විසින් යාපනයේ ඩෙල්ෆ්ට් දූපතේ සංචාරයක නිරත වීමෙන් අනතුරුව සමාජ මාධ්‍යයේ පළකළ සටහනක් මේ වනවිට ඉතිහාසය, පුරාවිද්‍යාව සහ රාජ්‍ය තාන්ත්‍රිකභාවය පිළිබඳ පුළුල් සංවාදයකට මග පාදා තිබේ.**

ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි පාෂාණමය ලක්ෂණයක් නිරීක්ෂණය කළ මහකොමසාරිස්වරයා සිය X ගිණුමේ "Visited Hanumanji's footprint at Delft Island (Tamil name - Neduntheevu), Sri Lanka" යනුවෙන් සටහනක් පළකළේය. එම ප්‍රකාශයත් සමගම සමාජ මාධ්‍ය තුළ දැඩි ප්‍රතිචාර රැසක් මතුවිය.

විවේචකයන්ගේ ප්‍රධාන තර්කය වන්නේ, ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි අදාළ පාෂාණමය සලකුණ හනුමාන්ගේ පා සලකුණක් බවට පිළිගත හැකි පුරාවිද්‍යාත්මක හෝ විද්‍යාත්මක සාක්ෂි නොමැති තත්ත්වයක් තුළ, එය නිශ්චිත කරුණක් ලෙස ඉදිරිපත් කිරීම ගැටලුකාරී බවයි.

ඉතිහාස ගවේෂකයන් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ නිල පුරාවිද්‍යා වාර්තා, මහාවංශය ඇතුළු සම්ප්‍රදායික ඉතිහාස මූලාශ්‍ර හෝ විද්‍යාත්මක පර්යේෂණ කිසිවක් මගින් ඩෙල්ෆ්ට් දූපතේ හනුමාන්ගේ පා සලකුණක් ඇති බව තහවුරු කර නොමැති බවයි. ඔවුන්ගේ මතය වන්නේ මෙවැනි ප්‍රකාශ විශ්වාස සහ ඉතිහාසය අතර සීමාවන් අපැහැදිලි කළ හැකි බවයි.






රාමායන මහා කාව්‍යය ඉන්දියානු සංස්කෘතික සහ ආගමික උරුමයේ වැදගත්ම කෘතියක් ලෙස සැලකේ. එහි විස්තර වන රාම, සීතා සහ හනුමාන් සම්බන්ධ සිදුවීම්වලට අදාළ ස්ථාන ලෙස ශ්‍රී ලංකාවේ ස්ථාන රැසක් සංචාරක ව්‍යාපෘති තුළ හඳුන්වා දී ඇත.

කෙසේ වෙතත්, බොහෝ ඉතිහාසඥයන්ගේ මතය වන්නේ රාමායනය සාහිත්‍යමය හා ආගමික මහා කාව්‍යයක් වන අතර එහි සියලු සිදුවීම් ඓතිහාසික සත්‍යයන් ලෙස පිළිගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති බවයි.

අනෙක් අතට, හින්දු භක්තිකයන් සහ රාමායන සම්ප්‍රදාය අනුගමනය කරන පිරිස් පවසන්නේ මෙම ස්ථාන ආගමික හා සංස්කෘතික වැදගත්කමක් සහිත පූජනීය ස්ථාන බවයි. ඔවුන්ගේ අදහස වන්නේ මහකොමසාරිස්වරයාගේ ප්‍රකාශය එම ආගමික සම්ප්‍රදාය පිළිබඳ ගෞරවාන්විත සඳහනක් පමණක් බවයි.



# වවන්නෝ දිනන්නෝ කිව්වට වවන්න ගිහිල්ලා පරදින්නත් පුළුවන්



**එකමත් එක දවසක ඔබ ගමනක් යමින් ඉන්නවා. ඔබ එදා එතරම්ම කාර්යබහුල නෑ. මගදී හම්බවෙන ප්‍රියමනාප තරුණයෙක් හෝ තරුණියක් ඇවිල්ලා ඔබව නතර කරගන්නවා.**

'එක්ස්කියුස් මී සර්, පොඩ්ඩක් කතා කරන්න පුළුවන්ද?'

ඔබ කාර්යබහුල නැති නිසා, නැත්නම් ඔබට ඔහු ප්‍රියමනාප බව අනුව ඔහුගේ ඉල්ලීමට එකඟ නොවී බැරි නිසා, ඔබ ඔහු කියන දේට ඇහුම්කන් දෙන්න පටන් අරගන්නවා. ඔහු මෙහෙම කියනවා.

'සර්, සර් කැමැතිද සර් මේ වල්ලපට්ටා වගාව පටන් අරගන්න? මෙහෙමයි සර්, අපේ ඉඩමක සර් ඉන්වෙස්ට් කරනවා. එතකොට අපි වල්ලපට්ටා ගස් ටික හිටවලා, අපිම ඒ ටික කපාගන්නවා. සර්ට තියෙන්නෙ සර් දැන් මුලින් ලක්ෂ 50ක් විතර...'

මේ මිල වෙනස් වෙයි ගොඩක් වෙලාවට මේ කතන්දරේ. ලක්ෂ 50ක්, ලක්ෂ 40ක්, ලක්ෂ 20ක්, මේ වගේ ගානක් කියලා ඔහු කියනවා. මේ මූලික යොදවන එක විතරයි. ඉඩමත් අපේ, ගසුත් අපේ, අපි ගස් හිටවන්නේ, සර් තමයි වියදම් කරන්නේ. අපි අවුරුදු 10කින් ගස් කපා ගන්නවා, සර්ගේ ආදායම හතර ගුණයකින් වැඩි වෙනවා.

ඔන්න ඔබට දාඩිය දානවා. තරු එකින් එක ඔබේ ඔළුවෙන් මතුවෙන්න පටන් අරගන්නවා. ඊට පිටිපස්සෙන් තියෙන අං දෙක එළියට එනවා. නැට්ට පිටිපස්සෙන් ටික ටික එන්න පටන් අරගන්නවා. ඔබ 'උම්බෑ' කියන්න ගන්නවා. අර ආපු ප්‍රියමනාප තරුණයා හෝ තරුණිය කලින් සූදානම් කරපු පුන්නක්කු බාල්දියක් දීලා ඔබව එක්කගෙන යනවා ඔවුන්ගේ කාර්යාලයට. ඔන්න අපි එනවා, ඔන්න මහත්තයලා, අනාගත ආයෝජනයක් වෙනුවෙන් හිටවනවා වල්ලපට්ටා.

මේ කතන්දරේ වෙනස් වෙන්න පුළුවන්. වල්ලපට්ටා, නයි මිරිස්, කිලෝ පේර, අරවා මේවා කියලා දැන් මේ කතන්දරේ එක එක තාලයට යනවා. ප්‍රශ්නයක් තියෙනවා, මම මෙවැනි කෙනෙක්ගෙන් අහපු.

'ඉඩමකුත් තියෙනවා නම්, පැළත් තියෙනවා නම්, ඔයාලාම ගන්නවා නම්, ඇයි ඔය මගේ ලක්ෂ 20ක්? අනාගත ආයෝජනයක් ඇස්පනාපිට පේන්න තියෙද්දී, නිකන් වළක් කපලා පැළ ටික හිටව ගන්න විතරනෙ තියෙන්නේ. එහෙම තියෙද්දී මොකටද මාව මේකට අතරමැදියෙක් කරලා, මට කෝටි ගානක් හොයලා දෙන්න ඔයාලා මහන්සි වෙන්නේ?'

තේරෙන්නේ නැති ප්‍රශ්නයක් ඒක. හැබැයි ඉතින් ඕකට කොහෙන් හරි ගැටයක් ගහලා, අමුණලා, මොනවා හරි කරලා කතන්දර ටිකක් කියනවා. ඔබ වැඩේට එකඟ නැත්නම්, ඔබට වැඩේ එපා නම්, බෑ වගේ නම්, ඔබ වැඩිය කතාබහ කර කර ඉන්න ඕනේ නැහැ. ඒගොල්ලෝ ටක් ගාලා ඔබව නිදහස් කරලා යවනවා. 'හොඳයි සර්, තැන්ක් යූ සර්' කියලා, ඔබට තියෙන්නේ 'බුදු සරණයි' කියලා ආපහු එන්න.

දැන් මේක වුණා කියමුකෝ. සල්ලි දුන්නා, ඔබව එක්කගෙන යනවා, වත්ත පෙන්නනවා, පැළ ටික තියෙනවා. 'ඔන්න සර්, සර්ගේ පැළ ටික අපි හිටවලා තියෙන්නේ. පැළ සර් ගණන් කරලා බලන්න, 124ක් තියෙනවා.'

අපි පැළ 124 වටේ ඇවිදලා, නිකන් අභිමානයෙන් බලලා, ඉඩම් අහිමි වැවිලිකරුවෙක් විදිහට සාඩම්බරෙන් ගෙදර එනවා. ඇයි අවුරුදු දහයකින් වල්ලපට්ටා ටික විකුණලා කරන දේවල් ටික ඔළුවේ තියාගෙන. හැබැයි කතන්දරේ නිකන් 'රතු හැට්ටකාරි' වගේ, මුට්ටිය බිඳුණොත් ඔක්කොම ඉවරයි කියලා අපිට මතක නැතුව යනවා.

මතක තියාගන්න, ඔබ ඉඩමට ගිහිල්ලා බලලා ආවා මිසක, ඔබ ඉඩම ගෙදර ගෙනාවේ නැහැ. ඔබ ඉඩමේ පැලක් හදාගත්තේ නැහැ. ඔබ ඉඩමේ නතර වුණේ නැහැ. ඔන්න මෙවැනි වැඩක් කළා නම් ඊළඟ වැඩේ කරන්න ඕනේ මොකක්ද?

'හරි බොහොම ස්තූතියි, මම මේ ඉඩමේ ඉන්නවා. මම ගෙදර යන්නේ නැහැ. මේක මගේ ඉඩමනේ?'

'නෑ සර්, සර් මේකට ආයෝජනය කරලා විතරනේ තියෙන්නේ. මේ ඉඩම අයිතිය අපිටනේ.'

අපි කියනවා ඉතින්, 'ලක්ෂ ගානක් ආයෝජනය කරලනේ තියෙන්නේ, ප්‍රශ්නයක් නෑ. මට ඉඩම ලියලා දෙන්න එපා, මම ගස් ටික බලාගෙන ඉන්නවා ඉඩමේ' කියලා.

එහෙම කතාවක් මිනිහෙක් කියන්නේ නැහැ කියලා මේ නෝනලා මහත්තයලා දන්නවා. ඔන්න ඔබේ කියපු වල්ලපට්ටා, නයි මිරිස්, ඔබේ කියපු පේර... මේ ඉඩම ඔයා දන්නවද මේ විදිහට පෙන්න පෙන්න තව කී දාහකගෙන් සල්ලි ගන්නවද කියලා? මෙවැනි විදිහට විශාල වශයෙන් එකම ඉඩම තවත් අයට පෙන්නමින් කූට ලෙස ව්‍යාපාරිකයෝ ලාභ ලබනවා. මේක තක්කඩි ව්‍යාපාරයක්. මේක තහනම් ව්‍යාපාරයක්. මේක නොකළ යුත්තක් සහ මෙවැනි දේවල්වලට ආයෝජනය නොකර ඉන්න ඔබට මොළේ කල්පනාව තියෙන්න ඕනේ.

අවාසනාවකට ප්‍රශ්නය වෙලා තියෙන්නේ අපේ මිනිස්සු හැමදාම මේ ගස් කේස්වලටයි, පිරමීඩවලටයි, අරවටයි මේවටයි අහුවෙනවා. අපේ මිනිස්සුන්ට ඕනේ ඉක්මනට සල්ලි. ෂෝට්කට්වලින් ගොඩ යන්න. මුදලක් යොදවලා, ආයෝජනය කරලා, කීයක් හරි හොයාගෙන එහෙම ගේමක් ගහගන්න නෙවෙයි.

මම ඔබට මෙහෙම දෙයක් කියන්නම්. පහුගිය දවසක මට මෙවැනි දෙයක් යෝජනා කරපුවාම මම ඔවුන්ට කියපු දේ තමයි 'මගේ ඉඩමක් තියෙනවා, අපි අපේ ඉඩමේ හිටවමු. ප්‍රශ්නයක් නැහැ, ඔබ වැඩ ටික ඔක්කොම කරලා දෙන්න. අපේ ඉඩමේ හිටවමු. මට ලැබෙන ලාභයෙන් 50%ක් ඔයාලා ගන්න, ඉතුරු 50% විතරක් මට දුන්නම ඇති. කැමැතිද?' කියලා.

ඒගොල්ලෝ එකඟ නෑ. එහෙම කැමැති වෙන්නේ නැහැ. විවිධ යෝජනාවල් ඔවුන්ට ඉදිරිපත් කළා. එක එක පන්නයේ යෝජනාවල් මම ඉදිරිපත් කළා. මිලියන ගානක් වියදම් කරන්න අවශ්‍ය වෙන්නේ නැනේ මගේ ඉඩම දුන්නම. ඒගොල්ලෝ පැළ ටික හිටවනවා, අපි නීතිඥවරයෙක් ඉදිරියේ ගිහිල්ලා අස්සන් කරනවා ලියවිල්ලක්. මගේ ඉඩමේ ඔවුන් පැළ ටික බලාගන්න ඕනේ, නඩත්තු කරන්න ඕනේ, ඔක්කොම ටික කරන්න ඕනේ. පැළ ටික නඩත්තු කරගන්න බැරුව ගියොත් පාඩුව දෙගොල්ලන්ටම, ඒක වෙනම කතාවක්. මගේ බිම දෙනවා, ඔවුන් පැළ ටික හිටවනවා, ඔවුන් වත්ත නඩත්තු කරනවා, මට ලැබෙන ලාභයෙන් 50%ක් අපි ඒගොල්ලන්ට දෙනවා.

එහෙම දේකට එකඟ වුණේ නැහැ. ඉතින් මේවට එකඟ වෙන්න අවශ්‍ය නැහැ. මෙවැනි දේවල්වලට සම්බන්ධ වෙන්න අවශ්‍ය නැහැ. මොකද අපි දන්නවා ලියවිලි නැතුව, අස්සන් කරන්න බැරුව, පොත්පත්වල ලියන්න නැතුව මේ වගේ දේවල් කරන්න ගියාම අපිත් පැටලෙනවා, ඒගොල්ලොත් පැටලෙනවා. ඒගොල්ලොත් අමාරුවේ වැටෙනවා, අපිත් අමාරුවේ වැටෙනවා.

සමහරවිට ඔබට ඔය කතා කරන තරුණයා හෝ තරුණිය මෙහි අගමුලක් දන්නේ නෑ. ඒ මනුස්සයා දන්නේ ඒ මනුස්සයාගේ ලොක්කා දවසකට කීයක් හරි ගෙවලා කියන්න කියපු කුණුහරුප ටික විතරයි. හරස් ප්‍රශ්න ඇහුවම දෙන්න උත්තර නැතුව යන්නේ ඒ මනුස්සයාට ඔය ගැන අවබෝධයක් නැති නිසා. ඇත්තටම ඒ කතාකරන මිනිහා හොරෙක් නෙවෙයි. කතාකරන මිනිහා හරි සාධාරණ, අහිංසක, අවංක මනුස්සයෙක් වෙන්න පුළුවන්. ඒත් අවාසනාවක මහත, මේක පිටිපස්සේ ඉන්නේ අපි දන්නේ නැති කූට තක්කඩි ව්‍යාපාරිකයෙක්.

මතක තියාගන්න මෙහෙම ලිපිය ලිව්වා කියලා මේක නතර වෙන්නේ නෑ. මේක තව මුහුණකින් එනවා, වෙන විදිහකින් එනවා. ඔබ තේරුම් ගත යුතු කාරණය වෙන්නේ විශාල ලාභ, විශාල වශයෙන් හම්බෙන මුදල්, විශාල වශයෙන් ඔබට ලබාදෙන්න උත්සාහ කරන උදව්, ඔබව ගොඩදාන්න හදන සමහර කූට ව්‍යාපාරිකයන්ට ඔබ අහුවෙන්න එපා. කවුරු කොහොම මොනවා කිව්වත් සිහිබුද්ධියෙන් අහලා, විශ්වාස කරනවද නැද්ද කියන එක ගැන හිතන්නයි ඔබට තියෙන වගකීම.



ජීවන පහන් තිළිණ



## අපේ රජවරු රුවන්වැලි සෑය - අභයගිරිය - ජේතවනය වගේ
# දැවැන්ත වෙහෙර විහාර කොළඹ ඉදි නොකළේ ඇයි?

**ශ්‍රී ලංකාවේ අභිමානවත් ඉතිහාසය ගැන කතා කරද්දී අපේ මනසට නිරායාසයෙන්ම නැගෙන්නේ අහස සිඹින රුවන්වැලිසෑය, අභයගිරිය, ජේතවනය වැනි දැවැන්ත ස්තූප සහ රජරට පුදබිමිය. නමුත් ඔබ කවදා හෝ සිතා බලා තිබෙනවාද ඉපැරණි රජවරුන් කොළඹ සහ ඒ අවට බස්නාහිර කලාපයේ මෙවැනි දැවැන්ත වෙහෙර විහාර ඉදි නොකළේ ඇයි කියා?**

මෙය හුදෙක් අහඹු සිදුවීමක් නොවෙයි. මේ පිටුපස ඉතා පැහැදිලි භූගෝලීය, ඉංජිනේරුමය සහ දේශපාලනික හේතු සාධක ගණනාවක් තිබෙනවා. අද අපි ඒ පිළිබඳ සරලව කරුණු විමසා බලමු.

**1. කොළඹ භූමියේ ස්වභාවය සහ ඉංජිනේරුමය බාධා**

දැවැන්ත ගොඩනැගිල්ලක් හෝ ස්තූපයක් ඉදිකිරීමේදී එහි සම්පූර්ණ බර දරාගත හැකි ශක්තිමත් පොළොවක් තිබීම අනිවාර්යයි. අනුරාධපුරය, පොළොන්නරුව වැනි වියළි කලාපයේ පොළොව අතිශය ශක්තිමත්, ඝන පස් තට්ටුවකින් යුක්තයි. නමුත් අතීතයේ 'කොළොම්තොට' සහ කැලණි මිටියාවත යනු ජලය පිරුණු වගුරු බිම් සහ දියළු පස බහුල කලාපයකි.

ජේතවනය වැනි ටොන් ලක්ෂ ගණනක් බර ගඩොල් ආකෘතියක පාදම කොළඹ වැනි මෘදු පසක් සහිත වගුරු බිමක පිහිටුවීම තාක්ෂණික වශයෙන් ඉතා අවදානම් මෙන්ම ප්‍රායෝගික නොවන කාර්යයක් විය.

**2. රාජධානි කේන්ද්‍රගත වී තිබීම**

ශ්‍රී ලංකාවේ ඉතිහාසයෙන් වසර 1,500කට වඩා වැඩි කාලයක් අපේ අගනුවර සහ ප්‍රධාන පාලන මධ්‍යස්ථාන පිහිටියේ රජරට (අනුරාධපුරය සහ පොළොන්නරුව) කේන්ද්‍ර කරගෙනයි. දැවැන්ත වෙහෙර විහාර යනු හුදෙක් ආගමික ස්ථාන පමණක් නොව, රජතුමාගේ බලය, ධනය සහ රාජ්‍යයේ සමෘද්ධිමත්භාවය ලෝකයට පෙන්වන සංකේතයන්ය. එබැවින් රජවරුන් සියලු දැවැන්ත නිර්මාණ තමන් ජීවත් වූ ප්‍රධාන අගනගරය ආශ්‍රිතව ඉදිකිරීමට කටයුතු කළා. කොළඹ කේන්ද්‍ර කරගත් කෝට්ටේ රාජධානිය බිහිවන්නේ ඉතිහාසයේ ඉතා මෑත භාගයකදීය (ක්‍රි.ව. 15 වැනි සියවසේදී).

**3. කෘෂිකාර්මික ආර්ථිකය සහ ශ්‍රම බළකාය**

අහස උසට දාගැබ් බඳින්නට නම් විශාල ධනයක් මෙන්ම ලක්ෂ ගණනක අතිවිශාල ශ්‍රම බළකායක් අවශ්‍ය වෙනවා. රජරට ප්‍රදේශයේ ඉදිවූ දැවැන්ත වැව් පද්ධතිය නිසා එහි කෘෂිකර්මාන්තය අතිශයින් දියුණු වූ අතර, ජනගහනයද ඒ අවට කේන්ද්‍රගත වුණා. ගොවිතැන් කටයුතුවලින් පසු ලැබෙන නිදහස් කාලයේදී මේ දැවැන්ත ජනකායේ ශ්‍රමය යොදාගෙන වෙහෙර විහාර ඉදිකළා. නමුත් අතීතයේ කොළඹ අවට එවැනි දැවැන්ත වාරි පද්ධතියක් හෝ විශාල ජනාවාස පැවැතියේ නැහැ.

**4. කොළඹ යනු හුදෙක් වෙළෙඳ වරායක් පමණක් වීම**

අතීතයේ සිටම කොළොම්තොට භාවිත වූයේ ආගමික මධ්‍යස්ථානයක් ලෙස නොව, ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ ප්‍රධාන තොටුපළක් ලෙසයි. අරාබි වෙළෙඳුන් ඇතුළු විදේශිකයන්ගේ වෙළෙඳ ගනුදෙනු සිදුවූ ප්‍රධාන කේන්ද්‍රය වූයේ කොළඹයි. මේ නිසා කොළඹ නගරය ආගමික මුහුණුවරකට වඩා වාණිජමය මුහුණුවරක් ගත් ප්‍රදේශයක් බවට පත්වුණා.

**5. යටත් විජිත සමයේ සිදුවූ අතිවිශාල විනාශයන්**

බටහිර ජාතීන් (පෘතුගීසි, ලන්දේසි, සහ ඉංග්‍රීසි) අප රට ආක්‍රමණය කිරීමේදී ඔවුන්ගේ ප්‍රධාන මූලස්ථානය කරගත්තේ කොළඹයි. කෝට්ටේ යුගයේදී කොළඹ සහ ඒ අවට (කැලණිය, පැපිලියාන, සුනේත්‍රා දේවි පිරිවෙන වැනි) යම් පමණක හෝ ඉදිවී තිබූ විශාල විහාරස්ථාන සහ කලා නිර්මාණ පෘතුගීසින් විසින් ඉතා කෘෘර ලෙස සම්පූර්ණයෙන්ම විනාශ කර දමා ඒ මත ඔවුන්ගේ බලකොටු සහ පල්ලි ඉදිකළා. මේ නිසා කොළඹ අවට තිබූ පැරණි බෞද්ධ උරුමයන් බොහෝමයක් අද වනවිට භූමියෙන් මැකී ගොස් අවසන්.

සාරාංශය:

කොළඹ සහ බස්නාහිර පළාතේ දැවැන්ත විහාරස්ථාන නොමැති වීමට ප්‍රධානතම හේතුව වන්නේ භූමියේ ඇති ඉංජිනේරුමය දුෂ්කරතා (වගුරු බිම්), අතීත ජනාවාස සහ ආර්ථිකය රජරට කේන්ද්‍රගත වී තිබීම සහ කොළඹ නගරය එදා සිටම වාණිජ නගරයක් ලෙස වර්ධනය වීමයි.

I Love Ceylon



මව්රට
ලිපිනය: නො: 22, ජයරත්න මාවත, කොළඹ 05
කර්තෘ මණ්ඩලය: 0112505134
ඊමේල්: news@mawratanews.lk
වෙබ් අඩවිය: www.mawratanews.lk
බෙදාහැරීම්: 0764 449 688
දැන්වීම්: 0114870063

උපුල් ජෝශප් ප්‍රනාන්දුගේ
# ගුරුදූ විග්‍රහය



# UNPය සහ SJBය අනුරට පින් දිය යුත්තේ ඇයි

**'පාස්කු බෝම්බය පුපුරනකොට රාජපක්ෂලා හිටියේ ඔක්තෝබර් කුමන්ත්‍රණ බෝම්බයට අහුවෙලා උන්හිටි තැන් නැතිවෙලා...'**
**කවුදෝ කීවේ පත්තර කඩේ පත්තර බලන ගමන්ය.**
**'ඉතින් උඹ කියන්නේ බෝම්බේ තිබ්බේ රාජපක්ෂලා කියලද...?'**
**මුදලාලි ඇහුවේ ඇදේටය.**
**'ඒක මම දන්නේ නැහැ. හැබැයි රාජපක්ෂලා තමයි පාස්කු බෝම්බය පාවිච්චි කරලා රනිල් මහත්තයාගේ ආණ්ඩුව පුපුරුවලා දැම්මේ...'**
**එහෙම කියාගෙන කඩේට ගොඩවුණු හාදයා පත්තරේත් නොගෙනම යන්න ගියේය.**

කතාවේ ඇත්තක් තිබේ. 2018 ව්‍යවස්ථා කුමන්ත්‍රණයක් කරලා එවක ජනාධිපති මෛත්‍රී රනිල්ව අගමැති ධුරයෙන් ඉවත් කරලා මහින්දව අගමැති කළ විට මහින්දට 113 පෙන්න ගන්න බැරිව ඉමහත් ලැජ්ජාවට පත්විය. ඉන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය මහින්දට වහාම අගමැති ධුරයෙන් ඉවත් වෙන්න යැයි නියෝග කළ විට මහින්ද අන්ත අසරණ විය. ඊට පෙර 2018 පුංචි ඡන්දයෙන් මහින්ද සහ පොහොට්ටුව ගත්ත ගැම්ම මහින්ද මෛත්‍රීගෙන් අගමැතිකම භාරගන්න ගොස් නැති කරගත්තේය. මහින්ද කරගත්ත ගොන්කම ගැන හිතාගන්න බැරිව පොහොට්ටුව තැන තැන වැටී සිටියදී පාස්කු බෝම්බය පිපිරුවේ රාජපක්ෂලාට සහ පොහොට්ටුවට ලොතරැයියක් ඇදුණා සේය.

බෝම්බය පිපිරුණු විගස තමන් ජනාධිපතිවරණයට එන බවට ගෝඨාභය විදේශ මාධ්‍යයන්ට ප්‍රකාශයක් කළේය. එතැන් සිට ගෝඨාභය, මහින්ද, බැසිල් ඇතුළු රාජපක්ෂ පවුලත්, පොහොට්ටුවත් විමල්, උදය, දිනේෂ් ඇතුළු පොහොට්ටුවේ සන්ධාන පක්ෂ නායකයනුත් එකතු කරගෙන වැඩේට බැස්සේය.

2004 රනිල්ගේ ආණ්ඩුව වට්ටවන්න චන්ද්‍රිකා ගහපු ගේම රනිල් කොටි හුරතල් කරනවා කියාය.

2019 රනිල්ගේ ආණ්ඩුව පුපුරුවන්න රාජපක්ෂවරු ගහපු ගේම රනිල් මුස්ලිම් ත්‍රස්තයන් හුරතල් කරනවා කියාය. 2004 රනිල් කොටි හුරතල් කරනවා කියන්න චන්ද්‍රිකාලා පාවිච්චි කළේ ප්‍රභාකරන්වය. 2019

> **බෝම්බය පිපිරුණු විගස තමන් ජනාධිපතිවරණයට එන බවට ගෝඨාභය විදේශ මාධ්‍යයන්ට ප්‍රකාශයක් කළේය. එතැන් සිට ගෝඨාභය, මහින්ද, බැසිල් ඇතුළු රාජපක්ෂ පවුලත්, පොහොට්ටුවත් විමල්, උදය, දිනේෂ් ඇතුළු පොහොට්ටුවේ සන්ධාන පක්ෂ නායකයනුත් එකතු කරගෙන වැඩේට බැස්සේය.**

## මහින්දලා පාස්කු ප්‍රහාරය එජාපයට කරකවපු හැටි

රනිල් මුස්ලිම් ත්‍රස්තවාදීන් හුරතල් කරනවා කියන්න රාජපක්ෂලාට ප්‍රභාකරන් වගේ චරිතයක් මුස්ලිම් ප්‍රජාව තුළ හොයාගන්න නොහැකි විය. ඔවුන් ප්‍රභාකරන්ට ආදේශ කළේ රනිල්ගේ ආණ්ඩුවේ ප්‍රබලතම ඇමැතිවරයා වූ රිෂාඩ් බදුර්දීන්ය. රාජපක්ෂවරු ඔහුව ත්‍රස්තවාදියකු ලෙස හංවඩු ගැසීය. රනිල් සහ යූ.ඇන්.පී. ආණ්ඩුව රිෂාඩ් ඇතුළු මුස්ලිම් ත්‍රස්තවාදීන්ට උඩගෙඩි දෙන මුස්ලිම් නායකයන් පෝෂණය කරලා බෝම්බ පිපිරෙන තෙක් ඇස් කන් පියාගෙන සිටියා යැයි රාජපක්ෂවරු චෝදනා කළහ.

බෝම්බය පුපුරපු දිනට පසු දිනම මහින්ද කාදිනල් හිමි හමුවෙන්න ගොස් බෝම්බය පිපිරුණේ ආණ්ඩුවේ වරදින් යැයි කාදිනල් හිමි ලවාම තහවුරු කර ගත්තේය.

මේ වෙලාවේ රනිල් හිටියේ වෙනම ලෝකයකය. ඔහුව හමුවෙන්න යන යූ.ඇන්.පී. මන්ත්‍රීවරුන්ට රනිල් කීවේ අමුතු කතාවකි.

'බලන්න මහින්දලා මේක මෛත්‍රීට කරකවන හැටි...'

රනිල් ඔවුන්ට කීවේය. රනිල් හිතුවේ මහින්දලාගේ වෛරය තියෙන්නේ මෛත්‍රී එක්ක නිසා, ආරක්ෂක ඇමැති මෛත්‍රී නිසා මහින්දලා බෝම්බයෙන් මෛත්‍රීව ඉවර කරයි කියලාය. මහින්දලා ඒ ලණුව රනිල්ට දීලා රනිල් ලව්වා බෝම්බ ප්‍රහාරයට වගකිව යුත්තේ ආරක්ෂක ඇමැති ලෙස මෛත්‍රී යැයි රනිල් සහ යූ.ඇන්.පී.ය ලව්වා කියවා ගත්තාද දන්නේ නැත. යූ.ඇන්.පී. මන්ත්‍රීවරු කීවේත් තම නායක සහ අගමැති රනිල්ව මෛත්‍රී ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලට සහභාගි කරගත්තේ නැති බවත්, බෝම්බයේ වගකීම මෛත්‍රී භාරගත යුතු බවත්ය.

ඒත් මේ වෙනකොට රාජපක්ෂලා මෛත්‍රී එක්ක එකට ජනාධිපතිවරණය තරග කරන්න ඩීල් එක දමාගෙන සිටියහ. ඒ, 2018 පුංචි ඡන්දයේදී මෛත්‍රීට හිමිවුණු ඡන්ද ලක්ෂ 14 සාක්කුවට දමාගන්නටය. මේ නිසා පාස්කු ප්‍රහාරය රනිල් සහ යූ.ඇන්.පී.ය පිට දමා යූ.ඇන්.පී.ය විනාශ කළ යුතු යැයි රාජපක්ෂවරු ගණන් හැදූහ.

පාස්කු බෝම්බයට ගින්දර තියා රාජපක්ෂවරු රටම ගිනි තැබූහ. රනිල් සහ යූ.ඇන්.පී.ය මිනිස්සුන්ට පෙනුණේ රට විනාශ කරන ත්‍රස්තවාදීන්ට කිරි පොවන දේශද්‍රෝහීන් ලෙසය. ප්‍රභාකරන්ට කිරි පොවා යුද්ධය අවසන් කරන්න මහින්දට ඉඩ නොදුන් රනිල් සහ

> **ඇමැති ධුරයෙන් ඉවත් කළ විජයදාස පළමු වරට රාජපක්ෂවරුන්ගේ වුවමනාවට ආණ්ඩුවේ ඉදිරි පෙළ අය මුස්ලිම් ත්‍රස්තවාදීන් සුරතල් කරනවා යැයි චෝදනා කළේය. පාස්කු බෝම්බය පුපුරා ගිය විට තමන් කලින් කී දේ හරි ගියා කියමින් ගෝඨාභය ජනාධිපති කරන්න එක් විය.**

යූ.ඇන්.පී.ය දැන් මුස්ලිම් ත්‍රස්තවාදීන්ට කිරි පොවා රට මුස්ලිම් ත්‍රස්තවාදීන්ගේ ක්ෂේම භූමියක් කරන්න යනවා යැයි රාජපක්ෂලා, උදයලා, විමල්ලා, දිනේෂ්ලා කී කතා ඇත්ත යැයි මිනිස්සු පිළිගත්හ. රනිල් සහ යූ.ඇන්.පී. ආණ්ඩුව ජාත්‍යන්තර මුස්ලිම් ත්‍රස්තවාදී ඉලක්කවලට මිනිස් බෝම්බ හදන රටක් බවට පත්කර ඇතැයි රාජපක්ෂවරුන් චෝදනා කළේ ලාංකික රැඩිකල් මුස්ලිම්වරු සිරියාවේ පුහුණුව ලබන බවට ජාත්‍යන්තර මාධ්‍ය වාර්තා උපුටා දක්වමින්ය.

රනිල් සහ යූ.ඇන්.පී. ආණ්ඩුව රාජපක්ෂවරු නිර්මාණය කළ මේ මුස්ලිම් සහ රනිල් - යූ.ඇන්.පී. විරෝධී සුනාමිය ඉදිරියේ කොයි තරම් අසරණ වූවාද කියනවා නම් ආණ්ඩුවේ මුස්ලිම් ඇමැතිවරුන් සියල්ලටම ඉවත් වෙන්න කීවේය.

චන්ද්‍රිකා සහ මහින්ද රනිල් සහ යූ.ඇන්.පී.ය විනාශ කළේ රනිල් සහ යූ.ඇන්.පී.යට කොටි හංවඩුව ගහලාය. යුද්ධය අවසන් වීමෙන් පසු මිනිස්සුන්ට කොටි හංවඩුව අමතක විය. 2015 රනිල් සහ යූ.ඇන්.පී.ය දින්නේ ඒ නිසාය. කොටි හංවඩුව ගලවාගෙන යාන්තම් දෙපයින් නැගිටින්න රනිල් සහ යූ.ඇන්.පී.ය උත්සාහ කරද්දී රාජපක්ෂලා රනිල්ට සහ යූ.ඇන්.පී.යට අයි.එස්.අයි.එස්. හංවඩුව ගැසූහ. යූ.ඇන්.පී. ආණ්ඩුවට සම්බන්ධකම් ඇති වෛද්‍ය සාෆි සිංහල බෞද්ධ කාන්තාවන්ට වඳ සැත්කම් කරනවා කියමින් රාජපක්ෂවරු, විමල්ලා, උදයලා රටම බය සන්ත්‍රාසයට පත් කළහ.

රාජපක්ෂලා රනිල්ට සහ යූ.ඇන්.පී. ආණ්ඩුවට එරෙහිව මේ මුස්ලිම් ත්‍රස්තවාදී හංවඩුව ගහන්නේ පාස්කු බෝම්බයටත් පෙරය. ඒ සඳහා ඔවුන් පාවිච්චි කළේ ජනාධිපති මෛත්‍රී සහ අගමැති රනිල් අතර ප්‍රශ්න හදමින් ගෝඨාභයගේ ගෝලයකු වූ ඇවන්ගාඩ් අධිපතිට එරෙහි චෝදනා යටපත් කළ විජයදාස රාජපක්ෂවය. ආණ්ඩුව ඇතුළේ සිට ආණ්ඩුව විනාශ කරන ඔහුව අධිකරණ සහ බුද්ධ ශාසන ඇමැති ධුරයෙන් ඉවත් කරන ලෙස යූ.ඇන්.පී.ය මෛත්‍රීට බල කළ විට මෛත්‍රී අකැමැත්තෙන් යූ.ඇන්.පී. හඬට කන් දුන්නේය.

ඇමැති ධුරයෙන් ඉවත් කළ විජයදාස පළමු වරට රාජපක්ෂවරුන්ගේ වුවමනාවට ආණ්ඩුවේ ඉදිරි පෙළ

## චන්ද්‍රිකාලා කොටි හංවඩුව එජාපයට කරකවපු හැටි

අය මුස්ලිම් ත්‍රස්තවාදීන් සුරතල් කරනවා යැයි චෝදනා කළේය. පාස්කු බෝම්බය පුපුරා ගිය විට තමන් කලින් කී දේ හරි ගියා කියමින් ගෝඨාභය ජනාධිපති කරන්න එක් විය.

පාස්කු බෝම්බය යූ.ඇන්.පී.යට කරකවා යූ.ඇන්.පී.ය සුන්නත්දූලි කළ රාජපක්ෂලාට සහ පොහොට්ටුවට අද පාස්කු බෝම්බය කරකැවී ඇත. ඒ, අන් කවුරුවත් නිසා නොව, අනුර කුමාර සහ ජවිපෙ නිසාය. හරි නම් යූ.ඇන්.පී.ය සහ සමගි ජන බලවේගය අනුරට මල් පහන් තියා පූජා කළ යුතුව ඇත.

**උපුල් ජෝශප් ප්‍රනාන්දු**

# කැලෑ කොලම අඩුපාඩු විතරක්ම දකින්නේ නෑ මේක නම් අගය කරන්නම ඕනෙ වැඩක්

**රටක පරිසර පද්ධතිය කියන්නේ ඒ රටේ ජීවනාලියයි. එය රැකුණොත් ඒ රටේ අනෙකුත් සියලු සත්වයන් සුරක්ෂිත වන බවද, එය පිරිහී විනාශ වුවහොත් අනෙකුත් සාධක සියල්ලම විනාශ වන බවද නියතයකි. මෙකී සදාතනික සත්‍යය තේරුම් ගන්නා රටක ජීවත්වන පුරවැසියන් ඉතා වාසනාවන්ත වේ. නීතිරීති අණපනත් මගින් රටක පරිසරය ආරක්ෂා කරන්න පාලකයන් හා අවශේෂ වගකිවයුතු නිලධාරීන් ක්‍රියාත්මක වනවා දැකීම පරිසරයට ආදරය කරන පුරවැසියන් වශයෙන් එකී ක්‍රියාදාමය ඇගයීම හා සහයෝගය ලබාදීම අනිවාර්යයෙන්ම සිදුවිය යුතු දෙයකි. අද 'කැලෑ කොලමේ' පූර්විකාව වෙන්වන්නේ පරිසරය සුරක්ෂිත කිරීම සඳහා ගත් එක් එක් සාධනීය පියවරයන් පැසසුම් කොට සාකච්ඡා කිරීමයි.**

වනාන්තර පද්ධතියේ 86%ක් පමණ රක්ෂිත වනාන්තර බවට පත් කිරීමට ගැසට් කිරීම, තෝරාගත් අලිමංකඩ කීපයක් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට වැඩකටයුතු සැලසුම් කිරීම, ජෛව විවිධත්වය අනුව ඒ ඒ අදාළ කලාප සුරක්ෂිත කිරීම, ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශ හඳුනාගනිමින් අවශේෂ ඒ පද්ධතියන් සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම, අලි - මිනිස් ගැටුම විසඳාලීම සඳහා පිළියෙල කර ඇති 2020 ක්‍රියාකාරී සැලැස්ම ගැන අවධානය යොමුකිරීම හා ඒවායේ අඩුපාඩු ඇත්නම් යාවත්කාලීන කිරීම සඳහන් කළ හැකිය.

පසුගිය ජූනි 05 වැනිදා තවත් එක් ලෝක පරිසර දිනයක් උදාවිය. ඊට සමගාමීව මෙරටද විවිධ වැඩසටහන් හා සමුළු සම්මන්ත්‍රණ ක්‍රියාත්මක විය. සෑම පරිසර දිනයකම ක්‍රියාත්මක වන දේට වඩා ඉන් ඔබ්බට ගිය තීන්දු තීරණ කීපයක් ගැනීමට පරිසර අමාත්‍යාංශය කටයුතු කිරීම ඉතා ප්‍රශංසනීය කටයුත්තක් බවද, පවතින පරිසර ආඥා පනත අවශ්‍ය පරිදි කාලීනව සංශෝධනය කොට ජූනි මස අවසන් වීමට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම කාලෝචිත ක්‍රියාවකි.

යල් පැනගිය නීති වෙනස් කොට වර්තමාන පරිසරයට හා සමාජයට අනුරූප වන අයුරින් අණපනත් සම්මත කරගැනීම සෑහෙන කාලයක සිට ප්‍රමාදව පැවැතීම නිසා පරිසරයේ සිදුවූ අලකලංචි බොහෝය. ඒවා දැන්වත් නිසි ලෙස කළමනාකරණය කිරීම පාලකයන් හා නිලධාරීන්ගේ වගකීම බව අවධාරණය කරන අතර, එය තේරුම් ගෙන කටයුතු කිරීම ගැන පරිසර බලධාරීන්ට පැසසුම් කළ යුතුය.

අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අවශ්‍ය මූලික අවධානය යොමුකර, 2020 ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යයනය කොට රාජ්‍ය නිලධාරීන් ඒ සඳහා උනන්දු කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර, ඊට අවශ්‍ය නීතිරීති යාවත්කාලීන කිරීම හා අනෙකුත් පාර්ශ්වයන්ගේ සහාය ලබාගැනීමද පැසසිය යුතු කාරණයකි. පරිසරයට හා එහි වෙසෙන සියලු සතුන්ට, විශේෂයෙන්ම අලි ඇතුන් ගැන නිරන්තර අවධානය හා දත්ත එක්රැස් කොට ඔවුන්ගේ සංරක්ෂණය උදෙසා කැපවෙන කුෂාන් සමීර ඇතුළු 'වයිල්ඩ් ටස්කර්ස්' සංවිධානයේ සාමාජිකයන්ද මෙකී වැඩපිළිවෙළ සඳහා සහයෝගය ලබාදීම අගය කළ යුතුය. සැඟවුණු අරමුණුවලින් තොරව ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික පාරිසරික සංරක්ෂණ වැඩපිළිවෙළකට ඔවුන් නිරන්තරයෙන්ම සූදානම් බවද සඳහන් කළ යුතුය.

වාණිජ අවශ්‍යතා හා පුද්ගලික අභිමතාර්ථ ඉටුකර ගැනීමට උත්සාහ දරන සුළු පිරිසක් අතරේ, අලි ඇතුන් මියයාමට පෙර කෙසේ හෝ ඔවුන්ගේ ඡායාරූප ගැනීමට කැසකවන්නන් ඉන්නා සමාජයක පටු ආකල්පවලින් බැහැරව රාජ්‍ය තන්ත්‍රය හා නිලධාරීන් සමග එක්ව අනාගත පාරිසරික සංරක්ෂණ කටයුතු සඳහා කුෂාන් ඇතුළු මෙකී කණ්ඩායමේ දායකත්වය පරිසරයට ආදරය කරන අප සැමගේ පැසසුමට ලක්විය යුතු බව 'කැලෑ කොලමේ' අදහස වේ.

මෑතකදී පරිසර විනාශයන්ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීන්දුවද ඉතාමත් වටිනා එකකි. එය අනාගතයට පූර්වාදර්ශයක් වනු ඇත. දශක ගණනාවක් ඇදි ඇදී විවිධ හැලහැප්පිලිවලින් පිරි පාරිසරික ප්‍රශ්න එක රැයකින් විසඳාලිය නොහැකි බව 'කැලෑ කොලම' අවධාරණය කරන අතර, තත්ත්වය එසේ වුවත් රටක පාරිසරික ප්‍රතිපත්තිය ජාතික අවශ්‍යතාවක් ලෙස සලකා නීතිගත කළ යුතු බවද අවධාරණය කරන්නෙමු. පාලකයන්ට හිතුමනාපේ සංවර්ධන ව්‍යාපෘති හිතු හිතු තැන්වල ඉදිකිරීමට අවසර නොදී නිසි පාරිසරික වාර්තාවන් ඇතුළු සියලු අනුමැතීන් නිසි පරිදි අනුමැතිය ලබාගෙන නිවාස සංවර්ධන ව්‍යාපෘති, කෘෂිකාර්මික ඉඩම් ව්‍යාපෘති හා අනෙකුත් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. වර්ග සැතපුම් 65,000ක පමණ භූමි ප්‍රදේශයක ජීවත්වන අප සියලු දෙනා මෙකී පරිසරයේ කොටස්කරුවන් බවත්, ඉදිරි අනාගතයේදී මෙරට වෙසෙන සියලු ජීවීන්ට තිරසාර පාරිසරික ප්‍රතිපත්තියක් තුළ නිදහසේ ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කළ යුතු බවත් 'කැලෑ කොලමේ' අපි දැඩිව විශ්වාස කරමු.




DOUBLETREE BY HILTON
WEERAWILA RAJAWARNA RESORT වෙතින්
THE RAJAWARNA WEDDING EXPERIENCE 2026




ඔබගේ සිහින මංගල්‍යය සැබෑ කරගැනීමට අවශ්‍ය සියල්ල එකම ස්ථානයකින් අත්විඳීමට දැන් අවස්ථාව උදාවී ඇත. 2026 ජූනි 27 සහ 28 දෙදින පුරා DoubleTree by Hilton Weerawila හි පැවැත්වෙන The Rajawarna Wedding Experience 2026, විවාහ සැලසුම් කරන ඔබ සඳහාම නිර්මාණය කළ සුවිශේෂ අත්දැකීමකි.

විවාහ උත්සවයක් සැලසුම් කිරීමේදී අවශ්‍ය වන ප්‍රමුඛතම සේවා සපයන්නන් රැසක් මෙහි එක්වන අතර, මනාල මනාලියන්ගේ ඇඳුම්, ස්වර්ණාභරණ, ඡායාරූපකරණය, සැරසිලි, විනෝදාස්වාද සහ උත්සව සේවා ඇතුළු ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමග සෘජුවම හමුවී ඔබගේ අවශ්‍යතා සඳහා සුදුසුම විසඳුම් සොයාගැනීමට මෙය කදිම අවස්ථාවකි.

මෙම විවාහ ප්‍රදර්ශනයේදී සහභාගි වන ප්‍රමුඛතම වෙළෙඳ නාම සහ සේවා සපයන්නන්ගෙන් සුවිශේෂ දීමනා සහ විශේෂ වරප්‍රසාද රැසක්ද අමුත්තන්ට හිමිවේ.

තවද, එදිනම අත්තිකාරම් ගෙවා තම විවාහ උත්සවය තහවුරු කරන යුවළයන්ට නොමිලේ ඉන්ධන වවුචරයක්, වටිනා ත්‍යාග රැසක් සහිත විශේෂ ත්‍යාග ඇදීමකට එක්වීමේ අවස්ථාව සහ ඔබගේ සිහින මංගල්‍යයට 50%ක් දක්වා වට්ටම් දිනාගැනීමේ සුවිශේෂ අවස්ථාවක් හිමි වේ.

DoubleTree by Hilton Weerawila Rajawarna Resort හි රමණීය පරිසරය මධ්‍යයේ පැවැත්වෙන The Rajawarna Wedding Experience 2026, සාමාන්‍ය විවාහ ප්‍රදර්ශනයකට වඩා වැඩි අත්දැකීමක් වන අතර, සුවිශේෂ දීමනා සමග රන් හුයෙන් ඇඟිලි බැඳෙන ඔබගේ සුබ දිවි ගමනට අවශ්‍යය සියලු සේවාවන් එකම වහලක් යටින් ලබාගැනීමේ අනගි අවස්ථාවකි.

වැඩිදුර තොරතුරු සඳහා හෝ අප සමග සම්බන්ධ වීමට +94 77 120 1119 හෝ +94 76 336 9605 අංක අමතන්න.



# ලක්මාලි වරප්‍රසාද සහ යුක්තිය

**ශ්‍රී ලාංකීය සමාජ දේහය සහමුලින්ම කලඹමින්, ආගමික සහ සංස්කෘතික පදනම් දැඩි ලෙස ප්‍රශ්න කිරීමකට ලක්කළ අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සහ අටමස්ථානයේ හිටපු නායක පූජ්‍ය පල්ලේගම හේමරතන හිමියන් සම්බන්ධ ළමා අපචාර සිදුවීම මේ වනවිට නීතිමය ක්‍රියාවලියෙන් ඔබ්බට ගිය දැවැන්ත ව්‍යවස්ථාපිත සහ දේශපාලනික කුණාටුවක් බවට පරිවර්තනය වී තිබේ. මෙම සිදුවීමේ බරපතළකම හුදෙක් ආගමික සංස්ථාව දෙසට පමණක් නොව, මෙරට උච්චතම ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වන කමිටු, මන්ත්‍රී සංසද සහ මහජන නියෝජිතයන් සතු බලතලවල සීමාවන් කොතෙක්ද යන්න ප්‍රශ්න කරන තැනටම විහිදී ගොස් ඇත. විශේෂයෙන්ම, ජාතික ජන බලවේගයේ ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක වන ලක්මාලි හේමචන්ද්‍ර මහත්මිය මුල් වෙමින්, පාර්ලිමේන්තු කාන්තා මන්ත්‍රීවරියන්ගේ සංසදය වෙත ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිනිය සහ පරිවාස දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් කැඳවා, අධිකරණය හමුවේ පවතින නඩුවක ප්‍රගතිය සහ විමර්ශන සිදුවන ආකාරය පිළිබඳ ප්‍රශ්න කිරීම සමාජ මාධ්‍ය ජාලාවල මෙන්ම නීති ක්ෂේත්‍රය තුළද දැඩි කතාබහකට සහ දෝෂදර්ශනයට ලක්ව තිබේ. එහිදී නැගෙන ප්‍රධානතම සහ ප්‍රබලතම විවේචනය වන්නේ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීවරියට හෝ මෙම කාන්තා සංසදයට ස්වාධීන රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් ගෙන්වා මෙලෙස ප්‍රශ්න කිරීමට ව්‍යවස්ථාපිත හෝ නීතිමය බලයක් හිමිද යන්න පිළිබඳවය. 'අවශ්‍ය දේට මෙන්ම අනවශ්‍ය හැම දේටම' මෙලෙස මැදිහත් වෙමින් දේශපාලනඥයන් රටේ ස්වාධීන නෛතික ක්‍රියාවලීන්ට සහ විමර්ශනවලට ඇඟිලි ගැසීමේ හැකියාවක් පවතීද යන්න පිළිබඳවය.**

මෙම සමස්ත නෛතික පසුබිම සහ පාර්ලිමේන්තු සම්ප්‍රදායන් දෙස නීතිමය ඇසකින් බලන කල පෙනී යන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග යටතේ පිහිටුවා ඇති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA) හෝ අමාත්‍යාංශ උපදේශක කාරක සභාවලට පවතින නිල ව්‍යවස්ථාපිත බලතල, සාක්ෂිකරුවන් කැඳවීමේ සහ ලේඛන පරීක්ෂා කිරීමේ නෛතික ප්‍රඥප්තීන්, නිල වශයෙන් ලියාපදිංචි කරන ලද 'මන්ත්‍රී සංසදයකට' ඍජුවම හිමි නොවන බවයි. මන්ත්‍රීවරියන්ගේ සංසදය යනු පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කාන්තා සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපත්තිමය කරුණු සාකච්ඡා කිරීමට, යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට පිහිටුවා ඇති ව්‍යූහාත්මක එකමුතුවක් මිස, අපරාධ විමර්ශන සම්බන්ධයෙන් නිලධාරීන් කොටු කරමින් ප්‍රශ්න කිරීමට හෝ නඩු මෙහෙයවීමේ අධීක්ෂණ බලතල ක්‍රියාත්මක කිරීමට ව්‍යවස්ථාවෙන් අවසර ලත් ආයතනයක් නොවේ. එවැනි තත්ත්වයක, අධිකරණය හමුවේ විභාග වෙමින් පවතින, අතිශයින්ම සංවේදී සක්‍රීය නඩුවක් වටා ක්‍රියාත්මක වන ස්වාධීන රාජ්‍ය ආයතනයක ප්‍රධානීන් පාර්ලිමේන්තු කමිටු කාමරයක් වෙත කැඳවා ප්‍රශ්න කිරීම පැහැදිලිවම දේශපාලන බලය අනිසි ලෙස භාවිත කිරීමක් සහ තමන්ට හිමි ව්‍යවස්ථාපිත සීමාවන් ඉක්මවා යාමක් බව නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ මතය වී තිබේ. විමර්ශන පවතින ආකාරය හෝ ආයතන අතර සම්බන්ධීකරණයේ අඩුපාඩු සොයා බැලීමේ අරමුණින් යැයි පවසමින් මන්ත්‍රීවරියන් මෙලෙස ක්‍රියා කිරීම තුළින්, රටේ ස්ථාපිත නීතිමය පටිපාටිය සහ ආයතනික ස්වාධීනත්වය බරපතල ලෙස උල්ලංඝනය කිරීමකට ලක්ව ඇතැයි ඔවුන්ගෙන් නැගෙන චෝදනාව කිසිසේත්ම බැහැර කළ නොහැකිය.

මෙම සිදුවීමේ ඇති වඩාත්ම අවදානම්සහගත තත්ත්වය වන්නේ, මහජන නියෝජිතයන් තමන්ට පැවරී ඇති සැබෑ වගකීම්වලින් බැහැරව, සමාජයේ අවධානය දිනාගත හැකි සෑම සිදුවීමකටම මැදිහත් වෙමින් ස්වාධීන රාජ්‍ය නිලධාරීන්ට ස්වාධීනව සහ අපක්ෂපාතීව සිය රාජකාරි ඉටුකිරීමට ඇති ඉඩකඩ අහුරා දැමීමයි. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව මෙන්ම ශ්‍රී ලංකා පොලිසිය සහ නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආයතන ක්‍රියාත්මක විය යුත්තේ රටේ පවතින අපරාධ නීතිය සහ අධිකරණ නියෝගයන්ට අනුකූලව මිස, දේශපාලනඥයන්ගේ ඕනෑ එපාකම් හෝ ඔවුන් පවත්වන කමිටු රැස්වීම්වල උපදෙස් මත නොවේ. අධිකරණය හමුවේ පවතින නඩුවක් විභාග වෙමින් පවතින මොහොතක, දේශපාලනඥයන් මැදිහත් වී නිලධාරීන්ගෙන් ප්‍රශ්න කිරීම හරහා විමර්ශනවල සැබෑ දිශානතිය වෙනස් වීමට, සාක්ෂිකරුවන්ට වක්‍ර බලපෑම් එල්ල වීමට හෝ සමස්ත අධිකරණ ක්‍රියාවලියම දේශපාලනීකරණය වීමට දැඩි ඉඩකඩක් පවතී. යම් හෙයකින් මහජන නියෝජිතයන් තමන්ගේ පාලක බලයේ මහිමයෙන් හෝ දේශපාලන න්‍යාය පත්‍රයන් මත පිහිටා තමන්ට රිසි පරිදි නීතිය සහ විමර්ශන යාන්ත්‍රණය හැසිරවීමට උත්සාහ කරන්නේ නම්, එය රටේ නීතියේ ආධිපත්‍යයට මෙන්ම සමස්ත රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට එල්ල කෙරෙන දරුණුතම ප්‍රහාරයකි. මහජන නියෝජිතයන්ට පොදු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට අයිතියක් ඇතැයි ඇතැමුන් තර්ක කළද, එම මැදිහත් වීම් සිදුකළ යුත්තේ පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට සහ අධිකරණයේ ස්වාධීනත්වයට හානි නොවන පරිදි, අතිශයින්ම විනයගරුක සහ සීමාසහිත රාමුවක් තුළ පමණක් බව නීති විශාරදයන් තරයේ පෙන්වා දෙන්නේ එබැවිනි.

මෙම සමස්ත සිදුවීමෙන් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය සහ අධිකරණ ක්ෂේත්‍රය සතු බලතල බෙදීමේ සීමාවන් පිළිබඳ සමාජය තුළ පවතින බරපතළ අර්බුදයයි. මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය දේශපාලන අධිකාරියෙන් පූර්ණ වශයෙන් නිදහස් කර තිබේ. යම් අපරාධයක් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම, සාක්ෂි මෙහෙයවීම සහ ඊට අදාළ නෛතික පියවර ගැනීම ස්වාධීන පොලිසිය, නීතිපති දෙපාර්තමේන්තුව සහ ස්වාධීන අධිකරණය සතු සුවිශේෂ වගකීමක් වන බැවින්, දේශපාලන මන්ත්‍රී සංසදයන් හරහා කිසිදු මහජන නියෝජිතයකුට එම ක්‍රියාවලීන්ට ඍජුව හෝ වක්‍රව ඇඟිලි ගැසීමට කිසිදු නෛතික හෝ සදාචාරාත්මක අයිතියක් නොමැත. ලක්මාලි හේමචන්ද්‍ර මහත්මිය මුල් වෙමින් සිදුකළ මෙම මැදිහත් වීම වටා සමාජ මාධ්‍ය තුළ නැගෙන මූලික නෛතික තර්කය අතිශයින්ම සාධාරණ වන්නේ එබැවිනි. එනම්, මහජන නියෝජිතයන්ට ප්‍රතිපත්තිමය කරුණු අධීක්ෂණය කිරීමට බලය තිබූ පමණින්, අධිකරණය හමුවේ පවතින සක්‍රීය නඩුවලට හෝ විමර්ශන නිලධාරීන්ගේ රාජකාරිමය ස්වාධීනත්වයට බලපෑම් වන අයුරින් කටයුතු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන් සහ ව්‍යවස්ථාව සහමුලින්ම උල්ලංඝනය කිරීමක් වන බවයි. සැබෑ පුරවැසියාගේ අපේක්ෂාව විය යුත්තේ, චූදිතයාගේ තරාතිරම හෝ දේශපාලනඥයන්ගේ මැදිහත් වීම් කුමක් වුවත්, දේශපාලන බලපෑම්වලින් සහ ඇඟිලි ගැසීම්වලින් සහමුලින්ම තොරව, රටේ සාමාන්‍ය නීතිය සහ ස්වාධීන අධිකරණ පද්ධතිය මගින්ම වින්දිත දරුවාට උපරිම සාධාරණය ඉටුකිරීම පමණි.

*මාකස් ප්‍රනාන්දුපුල්ලේ*



## මත් උවදුර මඬින්න
## පොල්පිතිගම විශේෂ දැනුවත් කිරීමක්







'රටම එකට' විෂ මත්ද්‍රව්‍ය පිටුදැකීමේ හා නිවාරණය කිරීමේ අරමුණෙන් පැවැති පොල්පිතිගම ප්‍රාදේශීය කමිටු රැස්වීම නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් පසුගිය 04 වැනි දින පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්විණි. එහිදී විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සඳහා වන 'රටම එකට' ජාතික මෙහෙයුමේ සියලු සාකච්ඡා සිදුවිය.


මෙම අවස්ථාව සඳහා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ සියලු පොලිස් ස්ථානාධිපතිවරුන්, සහකාර ප්‍රාදේශීය ලේකම්, මහජන ආරක්ෂක කමිටු නියෝජිතයන් සහ ග්‍රාම නිලධාරීවරුන් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.

*චානක රුවන්*



රාජ්‍ය රහස්

# පාස්කු ප්‍රහාරයේ රහස් ලියුමක් ලීක් වෙයි



From: Landberg, Christopher A <LandbergCA@state.gov>
Date: Thu, Apr 7, 2022 at 6:45 PM
Subject: USG response to your request for support
To: ambassador@slembassyusa.org <ambassador@slembassyusa.org>

Ambassador Samarasinghe,

Thank you for raising with us Sri Lanka's request for an independent investigation into the Easter Sunday attacks. The bombings that took place on April 21, 2019, were both shocking and horrific, tragically claiming the lives of 269 people, including five U.S. citizens, and injuring hundreds of other innocent people. In the immediate aftermath of the attacks, and continuing to the present day, the U.S. government provided assistance in the investigation and prosecution of those responsible – to the point that the Department of Justice filed a criminal complaint in January 2021 against those deemed responsible for the deaths of U.S. citizens. In light of that, even as we stand ready to continue providing support to your government, it would not make sense for the United States to conduct an additional investigation into the attacks.

In terms of our cooperation on this case, I would like to highlight that the U.S. Federal Bureau of Investigation (FBI) has worked closely with Sri Lankan law enforcement, and in the week after the attack, deployed approximately 33 personnel to Colombo to assist Sri Lanka's Criminal Investigation Department with all aspects of their investigation. These efforts included evidence collection, witness and victim interviews, and exploitation of digital devices. In the months following the April 2019 attacks, the U.S. Ambassador and the FBI's Legal Attaché regularly briefed the then-President, Prime Minister, and Defense Minister on the ongoing investigation. That joint work culminated in the U.S. Department of Justice charging three suspects in the United States in January 2021, as noted above.

In addition to support for the 2019 investigation into the Easter attacks, the U.S. government – through the Department of Justice and Department of State's Bureau of Counterterrorism – has provided ongoing case-based mentoring and training to Sri Lankan prosecutors pursuing counterterrorism cases. The Department of State's Bureau of International Narcotics and Law Enforcement has also provided general judicial and prosecutorial assistance and training over several years. After the attacks, the Department of State also developed a proposal for broader counterterrorism cooperation, included in the non-paper we shared with you and your team on February 8, 2022.

Our team would be happy to facilitate additional briefings on our support for the investigation and our ongoing and potential counterterrorism assistance to your government. We also pledge to consider any additional requests from the Attorney General for support from U.S. prosecutors, two of whom are currently on the ground in Colombo. We look forward to continued collaboration to bring the perpetrators of the Easter Sunday bombings to justice and to further strengthening our counterterrorism cooperation.

Thank you. Very Respectfully, Chris

Christopher A. Landberg
Acting Principal Deputy Coordinator
Bureau of Counterterrorism
U.S. Department of State
Unclass Email: LandbergCA@State.Gov
Office: 202-736-4119
Mobile: 202-655-8793

කපිල පුංචිවත්තගේ

රාජ්‍ය රහස්

## සලේ නිසා සැලෙන්නෝ

**බරපතළ ආර්ථික, සමාජ ප්‍රශ්න රැසක් මධ්‍යයේ වුවද පසුගිය සතියේ දේශපාලන කරළියේ කතාබහට ලක්වූ ප්‍රධානම මාතෘකාව වූයේ පාස්කු ප්‍රහාරයේ චෝදනා මුල්කරගෙන අත්අඩංගුවට පත් වූ රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී සුරේෂ් සලේ මහතා විසින් ආරම්භ කොට තිබූ ආහාර වර්ජනයය.**

හෙතෙම ආහාර ගැනීම වර්ජනය කරමින් ඉල්ලා සිටි ප්‍රධාන කාරණයක් වූයේ තමන්ට එරෙහිව සිදුකරන පාස්කු ප්‍රහාරයේ විමර්ශනවලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර මහතා ඉවත් කරන ලෙසය. මෙහිදී ආහාර නොගැනීම හේතුකොට ගෙන සලේට ඇතිවූ සෞඛ්‍ය අපහසුතා හේතුවෙන් වහාම ඔහු කොළඹ ජාතික රෝහලට ඇතුළත් කිරීමට බලධාරීහු පියවර ගත්හ. නමුත් එහිදීද ඔහු තවදුරටත් ආහාර ගැනීමෙන් වැළකී සිටීම නිසා තත්ත්වය තවදුරටත් අයහපත් අතට පෙරළෙන ආකාරයක් දැකගත හැකි විය.

මේ අතරවාරයේ ඇවිලෙන ගින්නට පිදුරු දමමින් විමල් වීරවංශ, උදය ගම්මන්පිල ඇතුළු කණ්ඩායමක් කොටුව දුම්රියපළ ඉදිරිපිට සලේ වෙනුවෙන් සත්‍යග්‍රහයක් ආරම්භ කිරීමට පියවර ගත්හ. උදය, විමල් ඇතුළු හිටපු මන්ත්‍රීවරුන් පිරිසක් ඊට මූලිකත්වය ගත් ආකාරයක් දැකගන්නට ලැබුණද, එහි තිරය පිටුපස ලොකු කාර්යභාරයක් සිදුකළ අයකු වූයේ වෙන කවුරුවත් නොව සර්ව ජන බලයේ නායක දිලිත් ජයවීරය. ඒ අනුව තමන්ට අයත් මාධ්‍ය ජාලය හරහා දිලිත් මෙම සත්‍යග්‍රහයට දැවැන්ත ප්‍රචාරයක් ලබාදීමට පියවර ගත්තේය. ඊට හේතු වූ තිබුණේ දිලිත් සහ සලේ අතර මෙන්ම දිලිත් සහ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අතර ඇති අතිශය සමීප හිතවත්කමය. මේ වනවිට සලේගෙන් සිදුකළ ප්‍රශ්න කිරීම්වලින් මතුවූ තොරතුරු මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගෝඨාභයට එරෙහිව විදෙස් ගමන් තහනමක් ලබාගත් අතර, ඇතැම් ආරංචි මාර්ගවලින් කියැවෙන්නේ මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ගෝඨා අත්අඩංගුවට ගැනීමටද සූදානමක් ඇති බවකි.

මේ ආකාරයට විමල් ඇතුළු විපක්ෂයේ පක්ෂ නායකයන් කිහිප දෙනකු කොටුවේ සත්‍යග්‍රහයේ වාඩි වුවද පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂයේ දේශපාලන පක්ෂ නායකයන් අතිබහුතරයක් එම සත්‍යග්‍රහයට එක් නොවීම සම්බන්ධයෙන් විශාල කතාබහක් පසුගිය සතියේ ඇතිව තිබිණි. ඇතැම් පාර්ශ්වයන් සමගි ජන බලවේගය මෙම සත්‍යග්‍රහයට එක් නොවීම සහ ඒ සම්බන්ධයෙන් දැඩි නිහඬතාවකින් පසුවීම ප්‍රශ්න කරන ආකාරයක්ද දැකගත හැකි විය. සජබය මේ සම්බන්ධයෙන් නිහඬව සිටියේ වෙන කිසිවක් නිසා නොව, පාස්කු ප්‍රහාරය සිදුවූ දා සිටම ඒ සම්බන්ධයෙන් එක් ස්ථාවරයක සජබය සිටීම නිසාය. ඒ, ස්වාධීන සහ විනිවිද පෙනෙන සුළු විමර්ශනයක් හරහා පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියලු පුද්ගලයන්ට සහ එය සැලසුම් කළ මහමොළකරුවන්ට විධිමත් අධිකරණ ක්‍රියාවලියක් ඔස්සේ දඬුවම් ලබාදිය යුතු බවට වූ ස්ථාවරයේය. පාස්කු ප්‍රහාරය එල්ල වීමෙන් පසු ඒ සම්බන්ධයෙන් පැවැති සෑම පාර්ලිමේන්තු විවාදයකදීම සජබ නායක සජිත් ප්‍රේමදාස මහතා මෙන්ම එවක සජබ මන්ත්‍රීවරුන් වූ හරීන් ප්‍රනාන්දු, මනුෂ නානායක්කාර යන අයත්, මුජිබර් රහුමාන් මන්ත්‍රීවරයාත් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් දිගින් දිගටම එම ස්ථාවරයේ සිටිමින් කරුණු දැක්වූ ආකාරයක් දැකගත හැකි විය. එහිදී පැහැදිලිවම ඔවුන් කියා සිටියේ කුමන තනතුරක් දැරුවද ඊට සම්බන්ධ සියලු දෙනාම නීතිය ඉදිරියට රැගෙන ආ යුතු බවකි. මේ හේතුව මත විමල් සහ උදය විසින් සලේ වෙනුවෙන් ගෙනගිය දේශපාලන ප්‍රචාරක ව්‍යාපාරයට කිසිසේත්ම සම්බන්ධ නොවීමට සජබය මුල සිටම තීරණය කොට තිබිණි.

ඒ අනුව පසුගිය සතියේ පැවැති සමගි ජන බලවේගයේ කළමනාකරණ කමිටු රැස්වීමේදීද සලේ සම්බන්ධ මාතෘකාව ඇදී ආ ආකාරයක් දැකගත හැකි විය. එහිදී සාකච්ඡාවට එක්ව සිටි ඇතැම් සජබ මන්ත්‍රීවරුන් පවා සලේ වෙනුවෙන් සජබය පෙනී නොසිටින්නේ මන්ද යනුවෙන් ප්‍රශ්න කරද්දී සජිත් පැහැදිලිවම කියා සිටියේ සජබය මුල සිටම පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් එක් ස්ථාවරයක් ගත් බවත්, කුමන සිදුවීම් පැනනැගුණද කිසිසේත්ම එම ස්ථාවරය වෙනස් කළ නොහැකි බවත්ය. ඒ අනුව ඉදිරියටද සජබය එම ස්ථාවරයේ සිටිමින් කටයුතු කළ යුතු බවද එහිදී සජිත් කළමනාකරණ කමිටු රැස්වීමේදී අවධාරණය කර සිටියේය.

මීට අමතරව සලේ වෙනුවෙන් කොටුවේ පැවැති සත්‍යග්‍රහය ආරම්භ කිරීමේදී සහ පළමු දිනය ඇතුළත සලේට සමීපව කටයුතු කළ කිසිදු රාජපක්ෂවරයකු ඊට එක් නොවීම සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක්ද මතුව තිබිණි. මේ සම්බන්ධයෙන් අප mawratanews.lk වෙබ් අඩවියද විශේෂ අනාවරණයක් සිදුකිරීමෙන් පසු සත්‍යග්‍රහය ආරම්භ කර ගතවූ දෙවැනි දිනයේදී නාමල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේ සිට පැමිණ ඊට එක්වීමට කටයුතු කළ ආකාරයක් දැකගත හැකි විය. ඊට පෙරාතුව පොහොට්ටුවේ නායක මට්ටමේ කිසිදු නියෝජිතයකු ඊට එක්ව නොසිටි අතර, පළමු දිනයේ ඊට එක්වූ එකම පොහොට්ටුවේ නියෝජිතයා වූයේ කළුතර හිටපු මන්ත්‍රී සංජීව එදිරිමාන්න පමණි.

මීට අමතරව සත්‍යග්‍රහය ආරම්භ වී තුන්වැනි දිනය වනවිට තවත් විශේෂ සිදුවීමක්ද එහිදී සිදුවිය. ඒ, ගම්මන්පිල විසින් පැවැත්වූ මාධ්‍ය හමුවකදී සත්‍යග්‍රහයට ප්‍රහාර එල්ල කිරීමේ සූදානමක් ඇති බවට බුද්ධි අංශවලින් තොරතුරු වාර්තා කොට ඇති බවට විශේෂ අනාවරණයක් සිදුකිරීමය. එහිදී ඔහු වැඩිදුරටත් අදහස් දක්වමින් කියා සිටියේ ආණ්ඩුවේ යම් සම්බන්ධයක්ද ඒ සඳහා පවතින බවකි. කෙසේ වෙතත් සත්‍යග්‍රහය ආරම්භ වී තුන්වැනි දිනය වනවිට පැවැති අධිකරණ කටයුතුවලදී සලේව පංච පුද්ගල අධිකරණ වෛද්‍ය මණ්ඩලයක් හමුවට පමුණුවා විශේෂ විමර්ශනයක් කිරීමට නියෝග කොට තිබිණි. එම නියෝගය ලැබීමත් සමග එහි සවිකොට තිබූ අට්ටාල, කටවුට් ගලවා දමා සලේ වෙනුවෙන් පැවැති සත්‍යග්‍රහය අවසන් කිරීමට විමල්, ගම්මන්පිල ඇතුළු කණ්ඩායම පියවර ගත්හ. නමුත් එහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ ගම්මන්පිල අනාවරණ කළ ආකාරයටම කටුවාපිටියේ සිට පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් කණ්ඩායමක් ඊට පසු දින විමල්, උදයලා සලේ වෙනුවෙන් සත්‍යග්‍රහය කළ ස්ථානයට පැමිණ සාධාරණත්වය ඉල්ලා උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වීමය. යම් හෙයකින් ඒ වනවිට විමල්, උදයලා තවදුරටත් සත්‍යග්‍රහයේ සිටියේ නම් එහි විශාල කලබලයක් ඇතිවීමට නියමිතව තිබිණි. නමුත් මෙහි ඇති ප්‍රශ්නය වන්නේ මෙවැනි සිදුවීමක් වන බවට බුද්ධි අංශවලින් කල් තියා තොරතුරු විමල් ඇතුළු කණ්ඩායමට ලැබී තිබීමය.

## රහස් ලියුමක් ලීක්වෙයි

**සලේ මුල් කොටගෙන මේ ආකාරයේ සිදුවීම් සිදුවෙද්දී පසුගිය සතියේ පාස්කු ප්‍රහාරය මුල් කරගෙන තවත් බරපතළ ආන්දෝලනාත්මක සිදුවීමක් සිදුවිය. ඒ, පාස්කු ප්‍රහාරය සිදුවී දින කිහිපයකට පසු ඇමෙරිකාව මගින් ඒ සම්බන්ධයෙන් නිකුත් කළ ලිපියක් මාධ්‍ය මගින් අනාවරණ කිරීමය.**

මෙය පළමු වරට රටට අනාවරණ කළේ වෙන කවුරුවත් නොව ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවේ අධිකරණ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ අලි සබ්‍රි මහතාය. සමාජ මාධ්‍ය සමග කළ සම්මුඛ සාකච්ඡාවකදී විශේෂ අනාවරණයක් කරමින් මෙම ලිපිය පිළිබඳ අනාවරණ කළ අලි සබ්‍රි, එහිදී කියා සිටියේ මෙය පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් ඇමෙරිකාවේ එෆ්.බී.අයි. ආයතනය මගින් නිකුත් කළ ලිපියක් බවකි.

පාස්කු ප්‍රහාරය එල්ල වීමත් සමග ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා මුලින්ම ලංකාවට පැමිණි විදෙස් විමර්ශන ආයතනය වූයේ ඇමෙරිකාවේ එෆ්.බී.අයි. ආයතනයය. ඊට හේතුවී තිබුණේ ප්‍රහාරයෙන් ඇමෙරිකානුවන් කිහිප දෙනකුටද ජීවිත අහිමි වී තිබීමත්, ඒ වනවිට අයි.එස්. ත්‍රස්තවාදීන්ගෙන් ඇමෙරිකාවටද දැඩි තර්ජනයක් එල්ල වී තිබීමත්ය. ඒ අනුව ප්‍රහාරය එල්ල වීමත් සමග එම එෆ්.බී.අයි. නියෝජිතයන් ලංකාවට පැමිණ ඒ පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම නිසා මෙරට විමර්ශන නිලධාරීන්ට නොලැබුණු තොරතුරු සහ සාක්ෂි පවා ලබාගැනීමට එෆ්.බී.අයි. නිලධාරීන්ට හැකි විය. ඇතැමුන් ඒ අවස්ථාවේදී චෝදනා කර සිටියේ මෙරට සිදුකළ විමර්ශනයන්ට ලබාදිය යුතු සාක්ෂි සහ තොරතුරු පවා ඒ අවස්ථාවේදී එෆ්.බී.අයි. නිලධාරීන්ට ලබාදීමට ඇතැම් වගකිව යුත්තන් කටයුතු කොට තිබූ බවකි. කෙසේ වෙතත් එෆ්.බී.අයි. නිලධාරීන් ලංකාවෙන් පිටව ගොස් ඒ සම්බන්ධයෙන් වූ වාර්තාවක් ඇමෙරිකානු බලධාරීන්ට ලබාදීමට කටයුතු කොට තිබිණි.

එවකදී ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් කටයුතු කළේ පසුගියදා සිය ඉල්ලා අස්වීමේ ලිපිය භාරදුන් මහින්ද සමරසිංහය. ඒ අනුව එදා මහින්ද සමරසිංහ එෆ්.බී.අයි. ආයතනය විසින් පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් නිකුත් කළ වාර්තාවේ පිටපතක් තමන්ටද ලබාදෙන ලෙස ඉල්ලා ඇමෙරිකානු බලධාරීන්ට ලිපියක් යොමුකිරීමට කටයුතු කොට තිබිණි. ඒ, එවක විදේශ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ අලි සබ්‍රි විසින් ලබාදී තිබූ උපදෙස්වලට අනුවය. ඒ අනුව ඇමෙරිකානු බලධාරීන් ඊට අදාළ ලිපියක් අතිශය රහසිගත ආකාරයට මහින්ද සමරසිංහ වෙත නිකුත් කිරීමට කටයුතු කොට තිබිණි. පසුගියදා අලි සබ්‍රි විසින් එළියට දැම්මේ ඇමෙරිකානු බලධාරීන් විසින් මහින්ද සමරසිංහ වෙත යොමුකොට තිබූ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් වූ එම අතිශය රහසිගත ලිපියය. එවැනි ආකාරයෙක් ලිපියක් සමාජ මාධ්‍ය මගින් හිටපු විදේශ අමාත්‍යවරයකු විසින් අනාවරණ කිරීම කෙතරම් සදාචාරාත්මකද යන්න පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් මෙහිදී මතුවීම වැළැක්විය නොහැකිය. නමුත් හිටපු විදේශ අමාත්‍ය අලි සබ්‍රි මහතා විසින් එය අනාවරණ කර තිබී නිසා අපද එම ලිපියේ අඩංගු කරුණු 'රාජ්‍ය රහස්' තීරයේ මෙසේ පළකරන්නට කටයුතු කරමු.

ඊට අනුව 2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් නව හෝ අතිරේක ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම ඇමෙරිකානු රජය විසින් නිල වශයෙන් ප්‍රතික්ෂේප කර තිබේ. ශ්‍රී ලංකා රජය කළ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රිස්ටෝපර් ඒ. ලෑන්ඩ්බර්ග් විසින් ඇමෙරිකාවේ ශ්‍රී ලංකා තානාපති මහින්ද සමරසිංහ වෙත නිල විද්‍යුත් ලිපියක් යොමු කරමින් මේ බව දැනුම් දී ඇත. ප්‍රහාරය එල්ල වූ මොහොතේ සිටම ඒ සම්බන්ධ පරීක්ෂණ සහ නීතිමය කටයුතු සඳහා ඇමෙරිකාව උපරිම සහයෝගය ලබාදී ඇති බැවින්, තවත් අතිරේක පරීක්ෂණයක් පැවැත්වීමේ අවශ්‍යතාවක් නොමැති බව ඇමෙරිකාව පෙන්වා දී ඇත.

ප්‍රහාරය සිදුවී සතියක් ඇතුළත ඇමෙරිකානු එෆ්බීඅයි නිලධාරීන් 33 දෙනකු ලංකාවට පැමිණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමග එක්ව සාක්ෂි එකතු කිරීම සහ ඩිජිටල් උපාංග විශ්ලේෂණය ඇතුළු පුළුල් විමර්ශන රැසක් සිදු කළ බව එම ලිපියේ දැක්වේ. එම ඒකාබද්ධ පරීක්ෂණවල ප්‍රතිඵලයක් ලෙස, ඇමෙරිකානු පුරවැසියන් පස්දෙනෙකු ඇතුළු 269 දෙනෙකු ජීවිතක්ෂයට පත්වීම සම්බන්ධයෙන් වගකිවයුතු සැකකරුවන් තිදෙනෙකුට එරෙහිව 2021 ජනවාරි මාසයේදී ඇමෙරිකානු අධිකරණ දෙපාර්තමේන්තුව විසින් අපරාධ චෝදනා ද ගොනු කරනු ලැබීය. මීට අමතරව ත්‍රස්තවාදයට එරෙහි නඩු පවරන ලංකාවේ රජයේ නීතිඥවරුන් සඳහා ඇමෙරිකාව වසර කිහිපයක් තිස්සේ අඛණ්ඩව පුහුණුව හා අධිකරණ සහය ලබා දී ඇත.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ නීතිපතිවරයා විසින් කරනු ලබන ඕනෑම අතිරේක සහය ඉල්ලීමක් ඉදිරියටත් සලකා බැලීමට සූදානම් බවත්, පාස්කු ප්‍රහාරයේ වැරදිකරුවන් නීතිය හමුවට පැමිණවීම වෙනුවෙන් ඇමෙරිකාව තවදුරටත් කැපවන බවත් එම ලිපියේ වැඩිදුරටත් අවධාරණය කර තිබේ.

## අනුර දැඩි තීන්දුවක

**පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මේ ආකාරයට විවිධ සිදුවීම් රට ඇතුළේ පැනනැගෙද්දී පසුගිය සතියේ ආණ්ඩුව මුහුණ දුන් බරපතළ අර්බුදයක් වූයේ අගවිනිසුරුවරයාගේ සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස වසර දෙකකින් දීර්ඝ කිරීමට ඉදිරිපත්ව තිබූ යෝජනාවය.**

මාධ්‍ය මගින් මෙය අනාවරණ කිරීමත් සමග ඊට එරෙහිව මුලින්ම විරෝධය පළකරමින් නිවේදනයක් නිකුත් කොට තිබුණේ ලංකාවේ සියලු නීතිඥවරුන්ගෙන් සමන්විත වූ ශ්‍රී ලංකා නීතිඥ සංගමයය. නීතිඥ සංගමය ඊට විරෝධය පළකිරීමෙන් අනතුරුව මහාධිකරණ නීතිඥ සංගමය මගිනුත්, කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නීතිඥ සංගමය මගිනුත් ඊට විරෝධය පළකරමින් නිවේදන නිකුත් කිරීමට පියවර ගෙන තිබිණි. නීතිඥවරුන්ගෙන් ඊට එල්ල වූ විරෝධයට අමතරව දේශපාලන පක්ෂයක් වශයෙන් සමගි ජන බලවේගයද ආණ්ඩුවේ මෙම උත්සාහයට එරෙහිව වහාම නිල නිවේදනයක් නිකුත් කිරීමට පියවර ගත් ආකාරයක් දැකගත හැකි විය. මේ සම්බන්ධයෙන් පසුගිය සතියේ අප විශේෂ අනාවරණයක් කරමින් කියා සිටියේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා විසින් රටට තොරතුරු අනාවරණ කිරීම සඳහා සුජීව සේනසිංහ, දයාසිරි ජයසේකර සහ ෆයිසර් මුස්තාෆාගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක්ද පත්කළ බවකි. ඒ අනුව, නීතිඥ සංගම්ද එකතු කරගනිමින් ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී දැවැන්ත විරෝධයකට යෑමට මේ වනවිටත් සජබය සාකච්ඡා පවත්වමින් සිටින බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය.

මේ අතරවාරයේ ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාද පසුගිය සතියේ නීතිඥවරුන් කණ්ඩායමක් සමග පැවැති සාකච්ඡාවකදී මේ සම්බන්ධයෙන් යම් අදහස් හුවමාරුවක් සිදුකිරීමට පියවර ගෙන තිබිණි. එහිදී ජනාධිපතිවරයා විසින් මෙම මාතෘකාව මතුකිරීමත් සමග එහි සිටි නීතිඥවරුන් ඊට විරෝධය පළකළ බවත්, ඇතැත් අවස්ථාවලදී යම් යම් වාද විවාද හේතුවෙන් සාකච්ඡාව උණුසුම් එකක් බවට පත්වූ බවත් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. මෙහිදී සාකච්ඡාවේ සිටි නීතිඥවරුන් ජනාධිපතිවරයාට දිගින් දිගටම පෙන්වා දී තිබුණේ මේ ආකාරයට අගවිනිසුරුවරයාගේ සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම වැරදි පූර්වාදර්ශයක් බවත්, එය ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි එකක් බවත්ය. නමුත් ජනාධිපතිවරයා මෙහිදී පැහැදිලිවම නීතිඥවරුන්ට දැනුම් දී ඇත්තේ තමන් එය සිදුකිරීමට තීරණය කර ඇත්තේ අනිසි දේශපාලන වාසි ගැනීමේ අරමුණකින් නොවන බවත්, මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින අතිශය සංවේදී අධිකරණ කටයුතු අතරමග ඇන නොසිට තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යෑමේ අරමුණෙන් බවත්ය. යම් හෙයකින් අගවිනිසුරුවරයා සහ අතිසංවේදී නඩු කටයුතු මෙහෙයවන උපරිමාධිකරණ විනිසුරුවරුන්ට විශ්‍රාම යෑමට සිදුවුවහොත් ඉකුත් කාලයේ සිදුවූ යම් යම් අක්‍රමිකතා, දූෂණ සම්බන්ධ නඩුකරයන් කඩාකප්පල් වීමේ අවදානමක් ඇති බවද එහිදී ජනාධිපතිවරයා පැමිණ සිටි නීතිඥවරුන්ට පෙන්වා දුන්නේය.

නමුත් ජනාධිපතිවරයාගේ ස්ථාවරයට එකඟතාව පළකිරීමට සාකච්ඡාවට එක්ව සිටි නීතිඥවරුන් සූදානම් වූයේ නැත. ඔවුන් දිගින් දිගටම ජනාධිපතිවරයාට පෙන්වා දුන්නේ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම කිසිසේත්ම පිළිගත නොහැකි එකක් බවකි. ඒ අනුව, මෙම නීතිඥවරුන්ගේ විරෝධය උත්සන්න වීමත් සමග ජනාධිපතිවරයා සාකච්ඡාව අවසන් කිරීමට පියවර ගත්තේ 'හොඳයි අපි එහෙනම් මේක ගැන තව ටිකක් බලමු...' යැයි කියමිනි.

කෙසේවෙතත් පසුගිය අඟහරුවාදා පැවැති කැබිනට් මාධ්‍ය හමුවේදී අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතාත්, ඉන් අනතුරුව පාර්ලිමේන්තුවේදී අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර මහතාත් ආණ්ඩුව විසින් තවමත් අගවිනිසුරු ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමේ තීන්දුවකට එළඹ නොමැති බව කියා සිටියේ ජනාධිපතිවරයා හා නීතිඥ කණ්ඩායම සමග පැවැති සාකච්ඡාව අවසන් වී පැය කිහිපයක් ගතවීමෙන් අනතුරුවය.

එසේ වුවද අප මෙවර 'රාජ්‍ය රහස්' තීරයේ දැඩි වගකීමෙන් යුක්තව සහතික කොටම කියා සිටින්නේ ආණ්ඩුවේ ඇමැතිවරුන් එවැනි තීන්දුවක් ගෙන නොමැති බව කීවද, ජනාධිපතිවරයා විසින් අගවිනිසුරු ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස තවත් අවුරුදු 2කින් දීර්ඝ කිරීමේ තීන්දුව ගෙන අවසන් බවය. ජනාධිපතිවරයා කලින් ගෙන තිබූ එම තීන්දුවේ කිසිදු වෙනසක් මේ දක්වා සිදුකොට නොමැති බවද වගකීමෙන් යුතුව රටට අනාවරණ කිරීමට අප සූදානම්ය.

මීට අමතරව මේ වනවිට උපරිමාධිකරණ විනිසුරු ධුර 8ක් මාස ගණනාවක් තිස්සේ පුරප්පාඩු වී ඇති තොරතුරක්ද පසුගිය සතියේ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා විසින් පාර්ලිමේන්තුවේදී අනාවරණ කළේය. ඒ අනුව මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා විපක්ෂයේ පක්ෂ නායකයන්ගේ විශේෂ රැස්වීමක් පසුගිය සතියේ සජිත්ගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. ඒ අනුව සාකච්ඡාවට ආරම්භය ලබාදී යෙදී තිබුණු වෙනත් නිල වැඩකටයුත්තක් හේතුකොට ගෙන සජිත් එම රැස්වීමෙන් නික්ම ගියද අනෙකුත් පක්ෂ නායකයන් මේ සම්බන්ධයෙන් දීර්ඝව සාකච්ඡා කිරීමට පියවර ගෙන තිබිණි. අවසානයේදී ඔවුන් තීන්දු කොට තිබුණේ මෙම උපරිමාධිකරණ විනිසුරුවරුන් 8 දෙනා මේ දක්වා පත් නොකිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට විරෝධය පළකොට ලිපියක් යොමුකරන ලෙසට පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සභාවට දැනුම් දීමටය. ඊට අදාළ ලිපිය ඒ මොහොතේම කෙටුම්පත් කිරීමටද විපක්ෂයේ පක්ෂ නායකයෝ පියවර ගත්හ. එමෙන්ම අගවිනිසුරු ඇතුළු උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමට ජනාධිපතිවරයා ගෙන ඇති තීන්දුවට ඒකාබද්ධව විරෝධය පළකිරීමටද මෙහිදී විපක්ෂයේ පක්ෂ නායකයන් තීන්දු කොට ඇති බවක් ආරංචිය. ඒ අනුව ඉදිරියේදී විපක්ෂයේ දේශපාලන පක්ෂ සහ නීතිඥ සංගම් ඒකාබද්ධව ජනාධිපතිවරයාගේ තීන්දුවට විශාල විරෝධයක් දියත් කිරීමට සැලසුම් කොට ඇති බවක් ආරංචිය.

## ලියුම ආවා.. ෂා එනවා

**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසුරුවා හැර ඉරාන් වික්‍රමරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රිකට් අතුරු කමිටුවක් පත්කිරීමට ජනාධිපතිවරයා ගත් තීරණය සහ ඉන් අනතුරුව පැනනැගුණු විශේෂ සිදුවීම් සම්බන්ධයෙන් කිසිදු මාධ්‍යයක් හෙළි නොකළ විශේෂ තොරතුරු රැසක්ම පසුගිය සති දෙකේම 'රාජ්‍ය රහස්' තීරයෙන් වාර්තා කිරීමට අපි පියවර ගත්තෙමු.**

එහිදී ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ නියෝජිතයන් ලංකාවට පැමිණ ජනාධිපතිවරයා සමග පැවැත්වූ සාකච්ඡාවේ තොරතුරුත්, එක් අවස්ථාවකදී සාකච්ඡාව උණුසුම් වූ ආකාරය පිළිබඳවත් තොරතුරු අපි එහිදී වාර්තා කළෙමු. මෙම ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිල නිලධාරීන් වහාම මාස 3ක් ඇතුළත නිලවරණ පැවැත්විය යුතු බවට දැනුම් දුන් ආකාරයත්, ඒ සම්බන්ධයෙන් වූ නිල නිවේදනය ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් ඉදිරියේදී නිකුත් කිරීමට සැලසුම් කළ ඇති ආකාරය පිළිබඳවත් අපි එහිදී වැඩිදුරටත් පෙන්වා දුන්නෙමු.

අප අනාවරණ කළ පරිදිම පසුගිය සතියේදී ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය මගින් ජනාධිපතිවරයා වෙත නිල ලිපිය එවීමට කටයුතු කොට තිබිණි. අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ එම ලිපිය මගින්ද වහාම ක්‍රිකට් නිලවරණය පවත්වන ලෙසට ආණ්ඩුවට දැනුම් දී ඇති බවකි. යම් හෙයකින් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ මෙම ස්ථාවරයට පටහැනිව තවදුරටත් ක්‍රිකට් අතුරු කමිටුව පවත්වාගෙන යෑමට ආණ්ඩුව කටයුතු කළහොත් නැවත වතාවක් ශ්‍රී ලංකා ක්‍රිකට් තහනම් වීමේ අවදානමක් ඇති බව අමුතුවෙන් කිවයුතු නැත. ඒ අනුව වසරක කාලයක් පවත්වාගෙන යෑම අරමුණු කරගෙන ජනාධිපතිවරයා විසින් ඉරාන් වික්‍රමරත්නගේ සභාපතිත්වයෙන් ක්‍රිකට් අතුරු කමිටුවක් පත්කළද මේ වනවිට එම අතුරු කමිටුවේ ආයු කාලය මාස 3කට සීමා වනු ඇති බවක් දැකගන්නට පුළුවන.

මීට අමතරව අපට ඇති තවත් තොරතුරකින් කියැවෙන්නේ ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ සභාපතිවරයා වූ ජේ ෂා මහතා නුදුරේදීම මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ලංකාවට පැමිණීමට නියමිතව ඇති බවකි. ඒ අනුව ජේ ෂාගේ සංචාරයද ශ්‍රී ලංකාවේ ක්‍රිකට් සම්බන්ධයෙන් තීරණාත්මක එකක් වනු ඇති බවක් දැකගන්නට පුළුවන.

## රනිල් නැකතට එළියට

**පසුගිය බ්‍රහස්පතින්දා දිනයේදී එක්සත් ජාතික පක්ෂය මාස ගණනාවකට පසු පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම සිරිකොත පක්ෂ මූලස්ථානයේදී පැවැත්වීමට පියවර ගෙන තිබිණි. රැස්වීමෙන් අනතුරුව මාධ්‍ය හමුවේ අදහස් දැක්වූ හිටපු එජාප මැති ඇමැතිවරුන් මහත් ඉහළින් අදහස් දක්වමින් කියා සිටියේ රනිල්ට දැන් අලුත් හදවතක් බද්ධ කොට ඇති බවත්, ඒ නිසා රනිල් අවුරුදු 10කින් තරුණ වී ඇති බවත්, දැන් රනිල්ට ජනාධිපති ධුරය යළිත් ගත හැකි බවත්ය.**

නමුත් 'රාජ්‍ය රහස්' තීරයට වාර්තා වී ඇති තොරතුරුවලට අනුව නම් රනිල්ට සිංගප්පූරුවේ මවුන්ට් එලිසබෙත් රෝහලේදී බයිපාස් සැත්කමක් සිදුකිරීමෙන් අනතුරුව සති කිහිපයක් නේවාසිකව ප්‍රතිකාර ලබා ඉන් අනතුරුව සිංගප්පූරුවේ හෝටලයක තවත් දින ගණනාවක් විවේක සුවයෙන් ගතකිරීමට කටයුතු කොට තිබිණි. නමුත් එහිදී විෂබීජයක් ශරීරයට ඇතුළු වීම හේතුවෙන් නැවත වතාවක් රනිල් රෝහල්ගත කිරීමට පියවර ගැනිණ. ඒ අනුව යළිත් රනිල්ව ශල්‍යකර්මයකට භාජනය කළ සිංගප්පූරු වෛද්‍යවරුන් දැඩිව උපදෙස් ලබාදී තිබුණේ ඔහුගේ ඉදිරි ජීවිත කාලය ඉතාමත් ප්‍රවේශමෙන් යුතුව ගතකරන ලෙසටය. එමෙන්ම කෑම බීමෙන් දැඩිව ප්‍රවේශම් වන ලෙසටත් උපදෙස් දී තිබූ වෛද්‍යවරුන්, නිල නොවන ආකාරයට රනිල්ගේ වයසත් සමග වුවමනාවට වඩා දේශපාලන කටයුතුවලට මැදිහත් නොවන ලෙසට උපදෙස් ලබාදී තිබූ බවක්ද ආරංචිය. දැනටමත් රනිල්ගේ වයස අවුරුදු 77ක් වන නිසා යම්කිසි හදිසි රෝගී තත්ත්වයක් හෝ අපහසුතාවක් මතුවුවහොත් එය සුවවීමේ කාලය දීර්ඝ විය හැකි බවද මෙහිදී වෛද්‍යවරුන් රනිල්ට දැනුම්දීමක් කර තිබිණි. ඒ අනුව රනිල් ලංකාවට පැමිණියද පසුගිය මාසයක කාලය පුරාම එළිපහළියට පැමිණ නිල රාජකාරිවල යෙදුණේ නැත. අත්‍යාවශ්‍යම කාරණාවකට පමණක් යම් යම් පුද්ගලයන්ට ඇමතුම් ලබාදීම හෝ ඔවුන් සිය නිවෙසට කැඳවා සාකච්ඡා කිරීම ඒ මාසයක කාලයේදී රනිල් සිදුකළ දැය. එමෙන්ම වෛද්‍ය උපදෙස්වලට අනුව රනිල්ට අදටත් බර ආහාර හෝ බත් කෑමට නොහැක. ඒ අනුව රනිල් සිය ආහාර වේල් ලෙස ගන්නේ එළවළු, පලතුරු සහ සුප් වර්ග පමණි. රනිල්ගේ ඉදිරි ජීවිත කාලය කෙසේ වනු ඇද්ද යන්න තීරණය වන්නේ මේ ආකාරයට රනිල් ගතකරන ජීවන රටාව අනුවය.

කෙසේ වෙතත් මේ සියල්ල රටට සඟවාලමින් රනිල්ගේ සහෝදරයකු විසින් කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම අවසන් වීමත් සමග බොරු ප්‍රචාරක ව්‍යාපාරයක් සමාජ මාධ්‍ය හරහා දියත් කිරීමට පියවර ගෙන තිබිණි. රනිල්ගේ ඡායාරූපද යොදාගනිමින් දියත් කළ එම මාධ්‍ය මෙහෙයුමෙන් කියැවුණේ රනිල් මේ වනවිට සම්පූර්ණ ශරීර සෞඛ්‍යයෙන් යුතුව සිටින බවත්, රටේ ජනාධිපති ධුරය භාරගැනීමට පවා රනිල් සූදානම් බවත්ය. රනිල්ගේ සොහොයුරා මේ ආකාරයට රනිල් පුම්බමින් බොරු සමාජ මාධ්‍ය මෙහෙයුමක් දියත් කළද, මෙවර රාජ්‍ය රහස් තීරය ඔස්සේ රනිල් සම්බන්ධයෙන් තවත් විශේෂ තොරතුරක් හෙළිදරව් කිරීමට අප සූදානම්ය. ඒ අනුව නැවත වතාවක් ලබන මාසයේදී රනිල් සෞඛ්‍ය පරීක්ෂණ කිහිපයක් සඳහා සිංගප්පූරුව බලා පිටත්ව යෑමට නියමිතය. එහිදී සිදුකෙරෙන සෞඛ්‍ය පරීක්ෂණවලින් අනතුරුව රනිල් තවදුරටත් කළ යුතු දේ සහ නොකළ යුතු දේ වෛද්‍යවරුන් විසින් දැනුම් දීමට නියමිතය. මෙම තොරතුර අප මීට පෙරාතුව දැනගෙන සිටියත් සදාචාරාත්මක හේතු මත අප එය ඒ මොහොතේ හෙළිදරව් කිරීමට කටයුතු කළේ නැත. නමුත් රනිල්ගේ කලඑළි බැසීමත් සමග ඔහුගේ සහෝදරයා ඇතුළු නිවුස් ජ්ලාන්ට් කල්ලිය විසින් බොරු සමාජ මාධ්‍ය මෙහෙයුමක් ආරම්භ කොට තිබීම හේතුවෙන් මෙම තොරතුර අනාවරණ කිරීමට අපට සිදුව තිබේ. මන්දයත් මෙම තීරය කියවන සජබ පාක්ෂිකයන් පමණක් නොව, එජාප පාක්ෂිකයන්ද ඇත්ත තත්ත්වය හරිහැටි වටහාගෙන තිබිය යුතු වීම ඊට හේතුවය.

එමෙන්ම මෙවර අප තවත් හෙළිදරව්වක් කිරීමටද සූදානම්ය. පසුගිය බ්‍රහස්පතින්දා රනිල් පළමු වතාවට ප්‍රසිද්ධියේ පෙනීසිටිමින් කලඑළි බැස්සේද නිකන්ම ආවාට ගියා නොව, ඔහුගේ ජ්‍යොතිෂවේදියාගෙන් ලැබුණු නක්ෂත්‍ර උපදෙස්වලට අනුවය. ඉකුත් ජනාධිපතිවරණ පරාජයෙන් පසු සහ හෘදය සැත්කමෙන් පසු ඔහුගේ පෞද්ගලික ජ්‍යොතිෂවේදියා රනිල්ට දැනුම් දී තිබුණේ මේ වසරේ ජූලි මාසයේදී ගුරු කටකයට පිවිසීමෙන් පසු රනිල්ට නැවතත් හොඳ දේශපාලන කලදසාවක් උදාවීමට ඉඩ ඇති බවකි. ඒ අනුව රනිල් බ්‍රහස්පතින්දා දින පළමු වතාවට කලඑළි බැස්සේ මේ ජ්‍යොතිෂවේදියා



කපිල පුංචිමාන්නගේ

රාජ්‍ය රහස්

# රනිල් යළි සිංගප්පූරුවට

ලබාදුන් උපදෙසකට අනුවය. එමෙන්ම ඊට දින 3කට පෙර රනිල් මල් පාරේ පිහිටි කාර්යාලයට පළමු වතාවට පැමිණ විනාඩි 15ක් පමණ ගත කර තිබුණේද එම ජ්‍යොතිෂවේදියා විසින්ම ලබාදුන් නැකතකට අනුවය.

කෙසේ වෙතත් පසුගිය බ්‍රහස්පතින්දා පැවැති රැස්වීම ආරම්භ වීමට පෙරාතුව සියලු කෘත්‍යාධිකාර මණ්ඩල සාමාජිකයන්ට දැඩි නීතිරීති මාලාවක් නිකුත් කිරීමට පක්ෂයේ ප්‍රධානීන් පියවර ගෙන තිබිණි. ඉන් පළමු නීතිය වී තිබුණේ සියලු දෙනාම මුව ආවරණ පැළඳගෙන සිටිය යුතු බවය. එමෙන්ම කිසිදු සාමාජිකයකු රනිල්ට සමීප නොවී සිටිය යුතු බවත්, හැකිතාක් රනිල්ට දුරස්ථව සිටිය යුතු බවත් දැනුම් දී තිබිණි. ඒ අනුව කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම පුරාම කිසිදු එජාප නියෝජිතයකු රනිල් සමග සමීපව කතාබස් කළ ආකාරයක් දැකගන්නට ලැබුණේ නැත.

එමෙන්ම මෙම කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී තවත් විහිළුසහගත සිදුවීම් රැසක් සිදුවිය. ඉන් එකක් වූයේ රනිල් සම්බන්ධයෙන් රාජිත කළ කරුණු දැක්වීමය. මීට පෙරාතුව වරෙක රාජිත මාධ්‍ය හමුවේ කියා සිටියේ රනිල් යළි පාර්ලිමේන්තු නොඑන බවකි. ඉන් අනතුරුව එල්ල වූ පීඩනය නිසාදෝ රාජිත නැවත වතාවක් කියා සිටියේ රනිල් පාර්ලිමේන්තු පැමිණීමේ අවස්ථාවක් ඇති බවකි. නමුත් කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමෙන් පසු රාජිත කියා සිටියේ රනිල්ට දැන් ජනාධිපතිවරණයට තරග කිරීමට හැකියාව ඇතැයි කියාය. මීට අමතරව හරින් ප්‍රනාන්දුද මාධ්‍ය හමුවේදී කියා සිටියේ රනිල් අවුරුදු 10කින් තරුණ වී ඇති බවත්, රනිල්ගේ කොන්ද ශක්තිමත් වී ඇති බවත්, නැවතත් රනිල්ට රටේ අනාගතය භාරගත හැකි බවත්ය.

නමුත් රනිල් ගැන කතාකරන මේ සියලු දෙනාම අමතක කරන කාරණාවක් තිබේ. ඒ, 2029 ජනාධිපතිවරණය පවත්වන විට රනිල්ට අවුරුදු 80ක්ද ඉක්ම ගොස් ඇති බවය. එමෙන්ම රනිල් ජනාධිපතිවරණ 3කටම ඉදිරිපත් වී ඒ කිසිවකින් ජයග්‍රහණය කර නොමැති බවත්ය. රනිල් මුලින්ම ජනාධිපතිවරණයකට ඉදිරිපත් වූයේ 1999 චන්ද්‍රිකාත් සමගය. ඉන් චන්ද්‍රිකා ජයග්‍රහණය කළාය. දෙවැනි වර රනිල් ජනාධිපතිවරණයකට ඉදිරිපත් වූයේ 2005දී මහින්ද රාජපක්ෂ සමගය. ඉන් මහින්ද ජයග්‍රහණය කළේය. මේ අවස්ථා දෙකේදීම රනිල් තරගයට ආවේ විපක්ෂ නායකවරයා ලෙසය. නමුත් තුන්වැනි අවස්ථාවේදී රනිල් ජනාධිපතිවරණයට ඉදිරිපත් වූයේ රටේ ජනාධිපතිවරයා වශයෙන්ය. නමුත් ඉතිහාසයේ පළමු වතාවට බලයේ සිටි ජනාධිපතිවරයකු තුන්වැනි තැනට ඇදවැටෙමින් නින්දාසහගත දරුණු පරාජයකට අනුර කුමාර දිසානායක මහතා හමුවේ මුහුණ දීමට එහිදී රනිල්ට සිදුවිය. එමෙන්ම 2029දී රනිල්ට ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට සිදුව ඇත්තේ විපක්ෂ නායකවරයා ලෙස හෝ ජනාධිපතිවරයා ලෙස හෝ නොව ප්‍රාදේශීය සභා මන්ත්‍රීකමක් හෝ නොමැතිවය. එමෙන්ම ඒ වනවිට රනිල්ගේ වයස අවුරුදු 80ද ඉක්මවා ගොස්ය. එජාපය මේ වනවිට සූදානම් වන්නේ 2029 එවැනි ආකාරයේ දේශපාලන නාඩගමක් පෙන්නන්නටය.

මෙම වාතාවරණය දැන දැන එජාප එවැන්නක් සිදුකරන්නේ ඇයි? ඊට හේතුව වෙන මොකක්වත් නොව සජබය සහ එජාපය අතර ඇතිවීමට නියමිත සමගිය කඩාකප්පල් කිරීම සඳහා රනිල්, සාගල, වජිර ඇතුළු කිහිප දෙනෙකුට ඇති වුවමනාවය. නමුත් කනගාටුවට කරුණ වන්නේ සජබයේ සිටින පලපුරුදු යැයි කියන ඇතැම් ජ්‍යෙෂ්ඨ ඔළමොට්ටලයන්ට පවා රනිල් ගහන මේ ගේම නොතේරීමය. තමන්ගේ පක්ෂ නායකයා මාකට් කරගෙන පක්ෂය ජයග්‍රහණය කරවීමට ඔවුන්ට නොතේරීමය. රනිල් කරන දේශපාලන කුමන්ත්‍රණ හඳුනාගැනීමට නොහැකි වීමය. මේ සම්බන්ධයෙන් තවත් තොරතුරු රැසක් ඉදිරියේදී හෙළිදරව් කිරීමට අප සූදානම්ය.



## නාමල්ට ලනු දෙන්නේ කවුද?

**පොහොට්ටුවේ ජාතික සංවිධායකවරයා වශයෙන් පත්වීමෙන් පසු නාමල් යම් දේශපාලන පරිණතභාවයකට පත්ව ඇති බව බොහෝ දෙනා කියා සිටියද පසුගිය සති දෙකක කාලය ඇතුළත සිදුවූ සිදුවීම් දෙකක් මුල්කරගෙන තවමත් නාමල් පෙර සිටි නාමල්ම බවට සිතෙන ආකාරයක් දැකගන්නට තිබේ.**

අප එසේ කියන්නේ පොහොට්ටුවට දැන් සජබයෙන් ජ්‍යෙෂ්ඨයන් කඩාගත හැකි බවට කවුරුන් විසින් හෝ දී ඇති දේශපාලන ලනුවක් නාමල් විසින් මේ වනවිට ගිලදමා ඇති බව පෙනීයෑම නිසාය. නමුත් එය පොහොට්ටුවට හුමරංගයක් බවට පත්ව ඇත්තේ දවස් දෙකක් යනවිට එම සිදුවීම් අතේ පත්තුවී පොහොට්ටුවටත් නාමල්ටත් දේශපාලන වශයෙන් පව වීමට සිදුව තිබීම නිසාය.

මෙහි පළමු සිදුවීම සිදුවූයේ මීට සති දෙකකට ඉහතදීය. එහිදී පානදුරේ පැවැති පොහොට්ටුවේ රැස්වීමකදී විශාල ෂෝ එකක් දමමින් මහ මැතිවරණයට සජබයෙන් ඉදිරිපත් වී ඡන්ද 27000ක් ලබාගත් අයකු යැයි කියමින් එක්තරා පුද්ගලයකු පොහොට්ටු වේදිකාවට නැංවීමට කටයුතු කොට තිබිණි. නමුත් අන්තිමේදී අනාවරණ වූයේ පසුගිය පළාත් පාලන මැතිවරණයට සිය මව සමග ඉදිරිපත්ව ඡන්ද 23ක් පමණක් ලබාගත් අයකු මෙසේ පානදුර පොහොට්ටු වේදිකාවට නග්ගාගෙන ඇතැයි කියාය. අවසානයේදී එම සජබ සාමාජිකයා පමණක් නොව පොහොට්ටුවේ ප්‍රධානීන්ද එම සිදුවීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ සමාව ඉල්ලීමට පියවර ගෙන තිබිණි. ඒ හරහා පොහොට්ටුවට විශාල දේශපාලන අවාසියක් සිදුවූ ආකාරයක්ද දැකගන්නට ලැබිණි. නමුත් එසේ තිබියදී පසුගිය සතියේ නැවත වතාවක් එවැනිම ආකාරයේ ලොකු ෂෝ එකක් දැමීමට පොහොට්ටුව කටයුතු කර තිබිණි. එහිදී බළන්ගොඩ සජබ ආසන සංවිධායකයා යැයි කියමින් එක්තරා තරුණයකු පොහොට්ටුවේ පක්ෂ කාර්යාලයට ගෙන්වා නාමල් අතින්ම සංවිධායක ධුරයක් ලබාදීමට පිරිසක් කටයුතු කොට තිබිණි. නමුත් අවසානයේදී සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මාධ්‍ය හමුවක් කැඳවමින් කියා සිටියේ එම පුද්ගලයා බළන්ගොඩ සජබ ආසන සංවිධායකවරයා නොවන බවත්, අවම වශයෙන් පළාත් පාලන මැතිවරණයේ නාමයෝජනා ලැයිස්තුව සකස් කිරීමට හෝ නොහැකිව විනය ක්‍රියාමාර්ග ගෙන පක්ෂයෙන් ඉවත් කළ පුද්ගලයකු බවත්ය. අවසානයේ තමන්ට වෙනම වාහනයක් ගෙන රත්නපුරට ගොස් අදාළ නාමයෝජනා අලුතෙන් සකස් කිරීමට සිදුවූ බවද මද්දුමබණ්ඩාර එහිදී සඳහන් කර සිටියේය. පොහොට්ටුව මහා ලොකු ෂෝ එකක් දමා පසුගිය සතියේ පක්ෂ කාර්යාලයේදී ආසන සංවිධායකකමක් දී තිබුණේ එවැනි පුද්ගලයකුටය.

> **නාමල් අතින්ම සංවිධායක ධුරයක් ලබාදීමට පිරිසක් කටයුතු කොට තිබිණි. නමුත් අවසානයේදී සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මාධ්‍ය හමුවක් කැඳවමින් කියා සිටියේ එම පුද්ගලයා බළන්ගොඩ සජබ ආසන සංවිධායකවරයා නොවන බවත්, අවම වශයෙන් පළාත් පාලන මැතිවරණයේ නාමයෝජනා ලැයිස්තුව සකස් කිරීමට හෝ නොහැකිව විනය ක්‍රියාමාර්ග ගෙන පක්ෂයෙන් ඉවත් කළ පුද්ගලයකු බවත්ය.**

මෙහිදී පොහොට්ටුව තේරුම් ගෙන නොමැති කාරණය වන්නේ 50%ක් තිබූ පොහොට්ටුවේ ඡන්ද ගොඩෙන් 3% සිටි මාලිමාව ආණ්ඩු බලය අත්පත් කරගැනීම සඳහා විශාල ඡන්ද ප්‍රමාණයක් කඩමින් පොහොට්ටුව 2.5% දක්වා ඇදදැමූ ආකාරයය. ඒ අනුව ඔවුන්ට අහිමි වූ ඡන්ද යළි ලබාගත යුතුව ඇත්තේ මාලිමාවෙන් මිස සජබයෙන් නොවේ.

අනෙක් අතට බැසිල් රාජපක්ෂ මහතා පොහොට්ටුවේ මහමොළකරු වශයෙන් කෙදිනකවත් මෙවැනි ආකාරයේ අතේ පත්තුවෙන දේශපාලන ගේම් ගැසුවේ නැත. බැසිල් පොහොට්ටුව නිර්මාණය කොට වසර 3ක් යෑමට මත්තෙන් ජාතික මැතිවරණ තුනක් දිනා පොහොට්ටුව ජයග්‍රාහී පක්ෂයට බවට පත්කළේ තුන්කල් බලා ගැසූ දේශපාලන ගේම්වලින්ය. නමුත් මේ වනවිට බැසිල් දේශපාලනයෙන් ඉවත්ව සිටින නිසා පොහොට්ටුව සිල්ලර දේශපාලන ගේම්වලට යොමුවී ඇති ආකාරයක් දැකගැනීමට පුළුවන.



## අනේ අනුර යාපා...

**මේ අතර, පසුගිය සතියේ මාධ්‍ය වාර්තා කළ එක්තරා ඡායාරූපයක් හේතුකොට ගෙන පොහොට්ටුවේ පමණක් නොව ශ්‍රීලනිපයේ දේශපාලනයද හෙළිලී ගිය ආකාරයක් දැකගත හැකි විය. ඒ, ශ්‍රීලනිපයේ අනුර ප්‍රියදර්ශන යාපා නාමල් රාජපක්ෂ සමග එකට සිටින ඡායාරූපයක් මාධ්‍ය මගින් වාර්තා කිරීමත් සමගය.**

අනුර යාපා මුලින්ම දේශපාලනයට පිවිසියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්ය. ඉන් අනතුරුව පොහොට්ටුවට එක්වී දේශපාලනය කළ අනුර යාපා පසුව නැවත වතාවක් ශ්‍රීලනිපයට පැන දේශපාලනය කළ ආකාරයක් දැකගත හැකි විය. ඉන් අනතුරුව රනිල් සමගද පසුව මිලින්ද මොරගොඩ සහ නිමල් ලංසා එක්ව නිර්මාණය කිරීමට ගිය දේශපාලන ව්‍යාපාරයේ නායකයා වශයෙන් අනුර ප්‍රියදර්ශන යාපා පෙනී සිටියේය. නමුත් පසුව නැවතත් ඉන්ද ඉවත්වී අනුර යාපා නැවත ශ්‍රීලනිපය සමග එක්ව දේශපාලනය කිරීමට පටන් ගත්තේය. මෙසේ තැන් තැන්වල අගුපිල්වල ලගිමින් දේශපාලනය කළ අනුර යාපා පසුගිය සතියේ නාමල් සහ පොහොට්ටුවේ නියෝජිතයන් සමග මෙරට රාජකාරි කොට නික්ම යන ඉන්දීය නියෝජ්‍ය මහකොමසාරිස්වරයා සමග පසුගිය සතියේ සාකච්ඡාවකට එක්ව තිබූ ආකාරයේ ඡායාරූපයක් මාධ්‍ය මගින් පළකොට තිබිණි. තැන් තැන්වල ලගිමින් සිටි අනුර යාපා නැවතත් පොහොට්ටුවට එක්වී ඇති ආකාරයක් දැකගන්නට ලැබුණේ මෙම ඡායාරූපයත් සමගය. ඒ අනුව නාමල්ලා විසින් අනුර යාපාව ඩැහැගෙනද, එසේත් නැත්නම් සුපුරුදු පරිදි අනුර යාපාම නැවතත් පොහොට්ටුවට ගියාද යන්න කියන්න දන්නේ දෙවියන් වහන්සේ පමණි. කෙසේ වෙතත් මෙම ඡායාරූපය පළවීමත් සමගම ශ්‍රීලනිපයද මේ වනවිට පුදුමයට පත්ව සිටින්නේ නැවත වතාවක් අනුර යාපා නොකියාම පොහොට්ටුවට පැන ඇති බවක් දැගකන්නට ඇති නිසාය.

**කපිල පුංචිමාන්නගේ**

---

### චන්දන ශ්‍රීගේ කැබිනෙට්ටුව

## ගැසුවා කී බෙරයෙ බල මැන පළුත් නැත

**මල් පැළ වෙලා වල් පැළ මහ ගෙදර අද**
**වල් පැළ එදා මල් පැළ ලෙස පෙනෙනවද**
**නව පෙරළියක තතු හොඳ හැටි දකිනවද**
**විශ්වාසයෙහි ලොකු කඩතොලු පෙනෙති තද**

**ආචාරිය මහාචාරිය වැනි පට්ටම්**
**සුළියක දැවටීලා මෙන් විය අටපට්ටම්**
**එදවස රටට පෙන්වූ යස ඔපමට්ටම්**
**නව පිරිසක් ඇවිත් කෙරුවා කරුකුට්ටම්**

**අප හැම පිරිසිදුය ළඟ කිළි කුණු නෑනේ**
**නොමැතිව එහෙම මේ රට හැදුමට බෑනේ**
**එලෙසට දිනාගෙන මහජන අවධානේ**
**බලයට පැමිණ කළ කෙංගෙඩියක් නෑනේ**

**ප්‍රාදේශීය බලය ගැනුමට පොර කෑවා**
**විරුදුව එන අයට විස පොර කටු පෑවා**
**ගාගෙන හත්පොළේ හැම තැනකම නෑවා**
**දෙස්පාලුවෝ සැමට හොඳ පාඩම් මේවා**

**ඇසුවා හොඳ කතා අද ඉන් පලක් නැත**
**වැසුවා කියූ 'මත' මතුවී යළිත් ඇත**
**නැටුවා කියන රැඟුමක දැකුමකුත් නැත**
**ගැසුවා කී බෙරයෙ බල මැන පළුත් නැත**

---



## මල් සහ තෑගි පාරාදීසය
### LASSANA.COM අලුත්ම ශාඛාව

ශ්‍රී ලංකාවේ මල් සහ තෑගි සේවා ක්ෂේත්‍රයේ අසිරිමත් පෙරළියක් කළ Lassana.com, කොළඹ Cinnamon Grand Colombo හෝටල් පරිශ්‍රයේදී සිය නවතම සුඛෝපභෝගී මල් ප්‍රදර්ශනාගාරය පසුගියදා අතිඋත්කර්ෂවත් අන්දමින් විවෘත කරන ලදී.

මෙම සුවිශේෂ සන්ධිස්ථානය සමගින් කොළඹ සංචාරක හා lifestyle ක්ෂේත්‍රයේ සිය සලකුණ තැබූ Lassana.com, ශ්‍රී ලාංකීය පාරිභෝගිකයන්ගේ මල් සහ තෑගි අවශ්‍යතාවන්ට ගැළපෙන ඉහළම විසඳුම් පමණක් නොව, විශිෂ්ටතම මංගල සැරසිලි සේවාවන්ද එකම තැනකින් පිරිනමමින්, වඩාත් හෘදයාංගම අත්දැකීමකට පාරිභෝගිකයන්ට දොරගුළු විවර කරයි.

අගනගරයේ මෙම නවතම මල් පාරාදීසය, සුබ මොහොතින් විවෘත කරන ලද්දේ, කොමර්ෂල් බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සනත් මනතුංග මහතා සහ Lassana.com සන්නාම තානාපතිනි, 2025 ලෝක රූ රැජින කිරුළ සඳහා හිටපු ශ්‍රී ලංකා රූ රැජින අනුදි ගුණසේකර මෙනෙවිය විසිනි. ලස්සන සමූහ ව්‍යාපාරයේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ ආචාර්ය ලසන්ත මලවිගේ මහතා, එහි මල් අංශයේ ප්‍රධානී පීට් ඩි ජොන්ග් මහතා සහ Cinnamon Grand Colombo හෝටලයේ සාමාන්‍යාධිකාරී නසූම් අස්හර් මහතා ඇතුළු ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් රැසක්ම, මලින් පිරි සැන්දෑව වර්ණවත් කරමින් එක්ව සිටියහ.

ප්‍රියන්ත හෙට්ටිගේ

---

# දැන් චියා බබා... අපි ආයෙත් ජනාධිපති කරමු

**ලංකාවේ දේශපාලනය කියන්නේ ජාත්‍යන්තර සිනමා සම්මාන උළෙලකදී වුණත් 'හොඳම විද්‍යා ප්‍රබන්ධ සහ හාස්‍යෝත්පාදක' ගණයෙන් සම්මාන දිනාගත හැකි සුපිරිම නාට්‍යයකි. මේ දවස්වල සමාජ මාධ්‍ය පුරා කැරකෙන අලුත්ම ට්‍රේලර් එක ඇසුණු අපට බඩ අල්ලාගෙන හිනායෑම නතර කරගත නොහැකි විය. චිත්‍රපටයක්වත්, මෙගා ටෙලිනාට්‍යයක්වත් නොව, අපේ රටේ එකෝමත් එක දේශපාලන මුත්තණුවෙක් කර තිබෙන 'අපූරු වැඩක්' ගැන එහි කියැවේ.**

ආරංචියේ හැටියට මැතිතුමා පපුව පළා අලුත්ම අලුත් 'හාට් එකක්' දමාගෙන ඇත. ඉන්පසු එතුමාගේ වටේ සිටින වන්දිභට්ටයන් සහ දේශපාලන සට්ටැඹියන් රට වටේම බෙර ගසමින් යන්නේ මැතිතුමාට දැන් 'සුපිරි බලයක්' පහළ වී ඇති බවයි.

ඔවුන් කියන විදිහට හාස්කම් තුනකි:

පළමු හාස්කම - අලුත් හාට් එක දැමූ සැණින් වයස අවුරුදු 10කින් අඩුවී ඇත (ලෝක සෞඛ්‍ය සංවිධානයටත් පිස්සු වගේය)

දෙවැනි හාස්කම - ඉස්සරටත් වඩා දැන් 'හරිම ශක්තිමත්' ලු (දැන් ඉතින් බිත්ති පෙරළන්න වුණත් පුළුවන)

තුන්වැනි හාස්කම (සහ භයානකම එක) - 'දැන් ඉතින් ඔක්කොම හරි, ආයෙත් ජනාධිපති වෙන්නත් පුළුවන්'ලු.

අනේ අපොයි... ලෝකයේ සාමාන්‍ය මනුස්සයෙක් හදවතක් මාරු කරගන්නේ තව ටික කලක් ජීවත් වෙලා මැරෙන්නටය. හැබැයි අපේ රටේ දේශපාලකයෙක් හදවතක් මාරු කරගන්නේ තව ටික කලක් රට කාදමන්නටය. මැතිතුමාගේ වටේ ඉන්න උදවිය හිතාගෙන ඉන්නේ හදවත මාරු කළාම දේශපාලන කර්මය සහ කරුමය ඔක්කොම රී-සෙට් වෙනවා කියාය.

වයස අවුරුදු 10කින් අඩුවුණා නම් අපට තිබෙන්නේ පොඩි ප්‍රශ්න කිහිපයකි. එතුමා රටට කරපු විනාශය, පක්ෂයට කරපු විනාශය, ගත්තු ණය කන්දරාව සහ ගැසූ කොමිස් කුට්ටිවල වයසත් අවුරුදු 10කින් අඩු වෙනවාද? එතුමාගේ පරණ පව් ඔක්කොම අර අලුත් හදවතේ ලේ බින්දුත් එක්ක හේදිලා ගිහිල්ලාද? වයස 10කින් අඩුවුණා කියා, මොළේ වර්ධනයත් අවුරුදු 10කින් ආපස්සට ගොස් 'බබා' වී ඇත්දැයි අප දන්නේ නැත.

මේ ලෙඩේ හැදුණොත් ඉදිරියේදී අපට මෙවැනි දේශපාලන පුවත් ද අසන්නට ලැබෙනු නියතය:

'මැතිතුමාට අලුත් ඇස් දෙකක් බද්ධ කරයි - මින්පසු ජනතාවගේ බදු මුදල් හොරකම් කරන හැටි වඩාත් පැහැදිලිව පෙනේ....'

'මන්ත්‍රීතුමාගේ දණහිස් පොල්කටු දෙක මාරු කරයි - එක පක්ෂයකින් තව පක්ෂයකට පැනීමේ වේගය තුන් ගුණයකින් වැඩි වේ...'

ඇත්තටම මෙතැන තියෙන්නේ හදවතේ ප්‍රශ්නයක් නොවේ, මොළයේ ප්‍රශ්නයකි. ලෝකයේ දක්ෂම දොස්තරලාට පපුව පළා හදවතක් මාරු කළ හැකි වුවත්, බල ලෝභයෙන් කුණුවී ගිය දේශපාලනඥයකුගේ මොළය මාරු කළ නොහැක.

පපුව ඇතුළේ ගැහෙන්නේ කාගේ හෝ තරුණයකුගේ පිරිසිදු හදවතක් වුවද, ඒ හදවතින් ලේ පොම්ප කරන්නේ අර පරණ, රට බංකොලොත් කරපු, කුප්‍රකට දේශපාලන මොළයටමය. ලේ දිය හැකිමුත් මොළේ දිය නොහැක.

ගරු මැතිතුමනි, අලුත් හාට් එකක් දමාගෙන ඔබතුමා 'අයන් මෑන්' වුණත්, මේ රටේ ජනතාවට දැන් ඔබලාගේ දේශපාලන සෙල්ලම් ගැන 'ඇලපිල්ලක්වත්' නැත.

වටේ ඉන්න උදවිය ඔබව නැවත ජනාධිපති පුටුවේ වාඩි කරවන්නට හීන මැව්වත්, ජනතාව සූදානම් වන්නේ ඔබව කලින් යැව්වා වගේ ගෙදර යවන්නටය.

ඒ නිසා, ලැබුණු අලුත් ජීවිතයෙන් ඉතිරි ටික කාලය හෝ රටට තවත් හෙණ නොගස්සා, ගෙදරට වී කජු ටිකක් කන ගමන් නෙට්ෆ්ලික්ස් ෆිල්ම් එකක් බලාගෙන ඉන්නවා නම්, ඒක ඔබතුමා මේ රටට කරන ලොකුම පුණ්‍යකර්මයකි.

නැත්නම්, ලබන සැරේ ජනතාව දෙන 'ඡන්ද ප්‍රහාරයෙන්' අලුත් හාට් එක විතරක් නෙවෙයි, ඇඟේ තියෙන පරණ අස්ථි පද්ධතියත් හොයාගන්න බැරිවෙනු ඇත...



# මැති ඇමැතිවරු 19යි

# ළඟදීම කොටුවෙයි!

# ජනාධිපතිවරු 3යි



## මෙන්න පරීක්ෂණ ලැයිස්තුව
## 'මව්රට' අතිවිශේෂ හෙළිදරව්ව

**වත්මන් ආණ්ඩුව බලයට එනතුරු රාජපක්ෂවරුන්ගේ වත්කම් සොයන්නට තරම් එඩිතර නොවිය. වගකිවයුතු ආයතනවල නිලධාරීන්ට ඒ ගැන සොයා බලන්නට උනන්දුවක් පවා නොවිය. දැන් ඒ හැමෝගේම වත්කම් සොයා බලන්නට පටන්ගෙන හමාරය. ඒ අනුව මහින්ද රාජපක්ෂගේ පවා වත්කම් සොයන්න අල්ලස් කොමිසම පියවර ගෙන හමාරය. ඒවායේ ප්‍රතිඵලද තවත් මාසයක් දෙකක් යන විට බලාගත හැකිය.**

දූෂණ වංචා සහ අක්‍රමිකතා එල්ලවී අත්අඩංගුවට පත්ව ඇප මත මේ වනවිට රාජපක්ෂවරු 03 දෙනෙක් හිටපු ජනපතිවරයෙක් ඇතුළු හිටපු ඇමැතිවරු සහ නියෝජ්‍ය ඇමැතිවරු රැසක් සිටිති. ඒ අය මෙසේය.

01. නාමල් රාජපක්ෂ
02. යෝෂිත රාජපක්ෂ
03. බැසිල් රාජපක්ෂ
04. ජොන්ස්ටන් ප්‍රනාන්දු
05. විමල් වීරවංශ
06. චාමර සම්පත්
07. රනිල් වික්‍රමසිංහ
08. මර්වින් සිල්වා
09. කෙහෙළිය රඹුක්වැල්ල
10. ප්‍රසන්න රණවීර
11. සජින් ද වාස් ගුණවර්ධන
12. සතීසවම් වියාලේන්ද්‍රන්
13. රාමනාදන් අර්චුනා
14. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර
15. රාජිත සේනාරත්න
16. මනූෂ නානායක්කාර
17. ප්‍රේමලාල් ජයසේකර
18. ප්‍රසන්න රණතුංග
19. ශෂීන්ද්‍ර රාජපක්ෂ

(දකුණු පළාත් මහ ඇමැතිවරයෙක් වූ ශාන් විජයලාල්ද ඉකුත් සතියේදී අල්ලස් කොමිසම විසින් අත්අඩංගුවට ගත්තේය. මේ වනවිට ඔහු සිටින්නේ රක්ෂිත බන්ධනාගාරයේය)

දූෂණ, වංචා, ඝාතන, පැහැරගැනීම් ඇතුළු වත්කම් සම්බන්ධයෙන් ජනපතිවරු තුන්දෙනෙක් ගැනත් පුළුල් විමර්ශන

01. රනිල් වික්‍රමසිංහ
02. මහින්ද රාජපක්ෂ
03. ගෝඨාභය රාජපක්ෂ

අනුරගේ ආණ්ඩු සමයේදී නඩු ඉක්මන් වී වංචා දූෂණ සම්බන්ධයෙන් හිරේ ගිය හිටපු දේශපාලන බලවත්තු

01. හිටපු ක්‍රීඩා ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ බරපතළ වැඩ ඇතිව අවුරුදු 25යි
02. හිටපු වෙළෙඳ ඇමැති නලින් ප්‍රනාන්දු බරපතළ වැඩ ඇතිව අවුරුදු 25යි
03. හිටපු නියෝජ්‍ය ඇමැති සරණ ගුණවර්ධන බරපතළ වැඩ ඇතිව වසර 16යි
04. උතුරුමැද හිටපු මහ ඇමැති එස්.එම්. රංජිත් බරපතළ වැඩ ඇතිව වසර 16යි
05. එස්.එම්. රංජිත්ගේ පුද්ගලික ලේකම් හිටපු ඇමැති එස්.එම්. චන්ද්‍රසේනගේ බිරිඳ බරපතළ වැඩ ඇතිව වසර 16යි
06. හිටපු ඇමැති විමල් වීරවංශගේ බිරිඳ ශෂී වීරවංශ බරපතළ වැඩ ඇතිව වසර 02යි
07. හිටපු රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්තගේ සහෝදරයා වන ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති ජගත් සමන්ත බරපතළ වැඩ ඇතිව වසර පහමාරයි
08. හිටපු ඇමැති ඒ.එච්.එම්. ෆවුසි බරපතළ වැඩ ඇතිව වසර 02යි. එම දඬුවම වසර 10කට අත්හිටුවයි

වත්මන් ආණ්ඩුව බලයට ආවේම දූෂණය වංචාව පිටුදකින බව කියමිනි. ඒ අතර රාජපක්ෂ ආණ්ඩුව සමයේදී සිදුවූ අපරාධ ගොන්නක් ගැනම කියමින් ඔවුන් රට හමුවේ කියාපාන්නට වූයේ තමන් බලයට ආ සැණින් ඒ සෑම අපරාධයක් සම්බන්ධයෙන්ම විමර්ශන පවත්වා වගකිව යුත්තන් නීතිය හමුවට ගෙනවිත් දඬුවම් පමුණුවන බවය.

අනුර කුමාර දිසානායක ජනාධිපති ධුරයට පත්ව වැඩි කලක් යන්නට මත්තෙන් මැතිවරණ වේදිකාවේ කීවා සේම ඔහු ඒ වගකීම පොලිසියට පවරනු ලැබීය.

ශ්‍රී ලංකා පොලිසිය නිල වශයෙන් රට හමුවේ තැබුවේ ආන්දෝලනයට තුඩුදුන් ප්‍රධාන සිදුවීම් 07ක් සම්බන්ධයෙන් කඩිනමින් නැවත විමර්ශන පවත්වන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශය හරහා පොලිස්පතිවරයාට නියෝගයක් ලැබී ඇති බවය. ඒ වන විට පොලිස්පති ධුරයේ ප්‍රියන්ත වීරසූරිය මහතා සිටියේ වැඩ බලමිනි.

පොලිසියට පැවරුණු එකී විමර්ශන අතර ඉහළින්ම තිබුණේ 2019 වසරේ පාස්කු ඉරුදින එල්ල වූ අන්තවාදී ත්‍රස්තවාදීන්ගේ බෝම්බ ප්‍රහාර මාලාව පිළිබඳ විමර්ශනයයි. ඒ වනවිටත් එකී විමර්ශන පැවත්වෙමින් තිබුණේ ඇල්මැරුණු ස්වභාවයෙනි. පාස්කු ඉරුදින ප්‍රහාර මාලාවෙන් පසු රටින් පලාගියේ යැයි කියැවුණු සාරා ජෙස්මින් පවා මියගිය බවට වූ රස පරීක්ෂක වාර්තාද ඒ වනවිට එළියට දමා තිබුණේ බොහෝ දේවල් සඟවමිනි. ඒ හැම දෙයක්ම සිදුවෙමින් තිබුණේ පාස්කු ඉරුදින ප්‍රහාර මාලාවේ මහමොළකරු මෙන්ම කුමන්ත්‍රණකරුවන් ආරක්ෂා කරගැනීමට බව දැන් කියැවෙන අලුත්ම විමර්ශන තොරතුරුවලින් සහ කතාබහවලින්ද පැහැදිලිය.

එකී විමර්ශන ඔස්සේ දැන් හොඳ හොඳ කතා දවස

## අනුර කුමාර දිසානායක ජනපති ධුරයට පත්වීමෙන් අනතුරුව පොලිසියට භාරදුන් ප්‍රධාන විමර්ශන 7

[illegible]

කරයි.

රුපියල් මිලියන 73.4කට අධික වටිනාකමක් ඇති දේපළ උපයාගත් හැටි කියන්න ඩේසි ආච්චිගේ මැණික් මල්ලේ සිද්ධියට යෝෂිතට නඩු පිට නඩු වැටේ.

නීත්‍යනුකූලව උපයාගත් ආකාරය හෙළිකළ නොහැකි රුපියල් මිලියන 59කට අධික මුදලක් පෞද්ගලික බැංකු ගිණුම් තුනක ස්ථාවර තැන්පත් ලෙස තිබීම සම්බන්ධයෙන් යෝෂිත රාජපක්ෂට කොළඹ මහාධිකරණයේ නඩු පැවරේ.

පෞද්ගලික බැංකුවක පවත්වාගෙන ගිය ගිණුමකට රුපියල් මිලියන 17ක් බැරකිරීම සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණයෙන් හෝමාගම මහාධිකරණය යෝෂිත රාජපක්ෂට නීතිපති නඩු පවරයි.

ක්‍රිෂ් සමාගමෙන් රගර් ප්‍රවර්ධනය ගත් බව කියන රුපියල් මිලියන 70ක මුදලක් සාපරාධී ලෙස සාවද්‍ය පරිහරණය කළ බවට මුදල් විශුද්ධිකරණයෙන් නාමල් රාජපක්ෂට එරෙහි සාක්ෂි විභාගය ජූලි 07 සිට ඇරඹේ.

මල්වානේ ඉඩම මගේ නෙමෙයි කියා ආණ්ඩු බලය ඇතිවිට නඩු රැසකින් ගැලවුණත් නඩු පෝලිමක්ම දැන් බැසිල් රාජපක්ෂ පස්සේ එයි. නඩු දෙකකට වරෙන්තු. ජාත්‍යන්තර පොලිසියෙන් රතු නිවේදනයකුත් ගන්න හදයි.

අයථා ලෙස උපයා ගන්නා ලද මුදල් භාවිත කරමින් මාතර, එළියකන්ද පාරේ පිහිටි 'බ්‍රවුන්ස් හිල්' නමැති ප්‍රදේශයෙන් අක්කර එකහමාරක ඉඩමක් මිලදී ගැනීමේ නඩුවට බැසිල්ට මුල්ම වරෙන්තුව.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයට වෙන්කර තිබූ රුපියල් මිලියන 7.8ක මුදලක්, එහි නියමිත ප්‍රවර්ධන කටයුතුවලට නොයොදා 2014 වසරේ පැවති ඌව පළාත් සභා මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් ටීෂර්ට් 12,000ක් මිලදී ගැනීමට වැයකරමින් රජයට මූල්‍ය අලාභයක් සිදුකිරීම සම්බන්ධයෙනුත් බැසිල්ට වරෙන්තුවක්.

'සිරිලිය සවිය' ගැන ශිරන්තිගෙන් ප්‍රශ්න කරයි. ළඟදීම නඩු පැවරීමේ සූදානමක්.

'සිරිලිය සවිය' ගිණුමේ තිබූ රුපියල් මිලියන 35ක මුදලක් භාවිත කරමින් කොළඹින් ශිරන්ති රාජපක්ෂ ගේ නමින් මිලදීගත් ඉඩමක් සහිත නිවස ගැන අල්ලස් කොමිසමෙන් විමර්ශනයක්. නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය ඇයව කැඳවා පැය 04ක් ගැන ප්‍රශ්න කරයි.

කතරගම මැණික් ගඟ අසබඩ රක්ෂිතයේ ඉදිකළ ආන්දෝලනාත්මක මිලියන 40යේ නිවස වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ගනී. ගෝඨාභය සහ යෝෂිතගෙනුත් ප්‍රශ්න කරයි. විදුලි බිලේ ඇති ජී. රාජපක්ෂ යනු තමන් නොවේ යැයි ගෝඨාභය කියයි. අයිතිකරුවෙක් නොමැති එම දේපළ අපවත්වී වදාළ කිරිවෙහෙර නාහිමි ආචාර්ය අලුත්වැව සෝරත හිමි හැඳූ එකක් බව කියා විමර්ශන අවසන් කෙරේ.

මාධ්‍යවේදීන්ට කළ පහරදීම් සහ ඝාතන සම්බන්ධයෙන් යටපත් කළ විමර්ශන සහ නඩු වේගවත් කෙරේ. පහරදීම්, පැහැරගැනීම්, අතුරුදන් කිරීම් සහ ඝාතනය කිරීම් පිටුපස සිටි හමුදාවේ සහ හමුදා බුද්ධි අංශවල පිරිසක් ගැන අනාවරණයක්. එකම තැනකින් ඒ සියල්ල මෙහෙයවූ බවට තොරතුරු. මින්නේරිය කඳවුරෙන් 2019 සහ 2020 කාලයේදී ගිනිඅවි පැන්නූ විමර්ශනවලට නැවත පණ දෙයි. ටී 56 අවි 73ක් පන්නා පාතාලයට බෙදූ හැටි අනාවරණ කරගනී.

[illegible] යැයි කියන්නේ මහින්ද රාජපක්ෂ අතටය. තවත් මිලියන 20ක් ලබාදුන්නේ යැයි කියන්නේ එවක සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයාව සිටි ප්‍රියංකර ජයරත්නටය. ඒ හැරුණු කොට චමල් රාජපක්ෂගේ පුතෙක් වන ශෂීන්ද්‍ර රාජපක්ෂටත් කපිල චන්ද්‍රසේනගේ බිරිඳ ප්‍රියංකා නියෝමාලිටත් චෝදනා එල්ලවී ඇත. ශෂීන්ද්‍ර එකල ශ්‍රී ලංකන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.

මෙම වංචාවේ හැම රහසක්ම දන්නා කපිල චන්ද්‍රසේන සියදිවි හානිකර ගත්තද රටින් පලාගොස් සිටින ශෂීන්ද්‍රටත්, නියෝමාලිටත් බේරිල්ලක් නැත. දැනට ඔවුන්ට එරෙහිව අධිකරණයෙන් වරෙන්තු නිකුත් කර අවසන්ය. ඉදිරියේදී එම වරෙන්තුව ජාත්‍යන්තර පොලිස් රතු නිවේදනයක් බවට පත්වෙමින් ඔවුන් දෙදෙනා මෙරටට රැගෙන ඒම අල්ලස් කොමිසමේ අපේක්ෂාවයි. ඒ අතර මහින්ද රාජපක්ෂගෙන් ද අල්ලස් කොමිසම ප්‍රශ්න කරනු ලැබුවේ මෙම වංචාවට ඔහුගේ සම්බන්ධයක් ගැන චන්ද්‍රසේන මියයන්නට පෙර කර තිබූ ප්‍රකාශයක් මුල්කරගෙනය.

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ හිටපු සභාපතිවරයෙක් වන නිශාන්ත වික්‍රමසිංහ අවස්ථා දෙකකදීම වත්මන් රජය යටතේ අත්අඩංගුවට ගත්තේය. ඒ ඔහු සභාපතිවරයාව සිටි වකවානුවේ රටේ ජනාධිපතිවරයා වූ මහින්ද රාජපක්ෂ ඇතුළු පිරිසක් වෙනුවෙන් ගුවන් ගමන් මාර්ගයක් අත්තනෝමතිකව වෙනස් කර රජයට ඩොලර් දහස් ගණනක පාඩුවක් කිරීම සම්බන්ධයෙන් සහ 2014 වසරේ මැතිවරණ ව්‍යාපාරයට රජයේ මුදල් රුපියල් මිලියන 1.25ක් අවභාවිත කිරීම සම්බන්ධයෙනි. 2025 ජුනි 27 වැනිදා මුලින්ම අත්අඩංගුවට ගත් ඔහු ජූලි 15 වැනිදා ඇප මත නිදහස් විය. දෙවැනි වර ඔහුව අත්අඩංගුවට ගන්නේ 2026 මාර්තු 24දාය. ඒ, ඉන්ධන බිල්පත් වංචාවක් සම්බන්ධයෙනි. ඇප මත මේ වනවිට සිටින ඔහු මහින්ද රාජපක්ෂගේ බිරිඳගේ ඥාති සහෝදරයෙකි.

2008 - 2009 කාලවකවානුවේදී කොළඹ හා තදාසන්න ප්‍රදේශ ආශ්‍රිතව තරුණයන් 11ක් කප්පම් ගැනීමට පැහැරගෙන ගොස් අතුරුදන් කිරීම සම්බන්ධයෙන් වූ විමර්ශනද මෙතෙක් පැවැතියේ ඉබි ගමනින්ය. දැන් නැවතත් ඒ සම්බන්ධයෙන් විමර්ශනවලට පණ ලැබී ඇත්තේ නීතිපති උපදෙස් මත පසුගිය කාලයේ මුදාහැර සිටි හිටපු නාවික හමුදාපතිවරයෙක් වන රවීන්ද්‍ර විජේගුණවර්ධන නැවත සැකකරුවෙක් ලෙස නම්කරමිනි.

ගෝඨාභය පාලන සමයේදී රසායනික පොහොර එක රැයින් තහනම් කරමින් චීනයේ 'කිංඩාඕ සීවින් බයෝටෙක්' සමාගමෙන් ගෙන්වන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 6.9ක අසූචි පොහොර නැව සම්බන්ධයෙන් වූ විමර්ශනයක් රට තුළ සිදුවන්නේ දැන්ය. මෙරටට නොලැබුණු පොහොර තොගයක් සම්බන්ධයෙන් ගෙවූ ඒ මුදල සම්බන්ධයෙන් ඇත්තේ ආන්දෝලනාත්මක තත්ත්වයකි. වත්මන් රජය යටතේ විමර්ශන ආරම්භ කරමින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් මහේෂ් ගම්මන්පිල මහතා අත්අඩංගුවට ගත්තේය. මේ ගැන එවකට කෘෂිකර්ම ඇමැතිවරයාව සිටි මහින්දානන්ද අලුත්ගමගේ සහ රාජ්‍ය අමාත්‍ය ශෂීන්ද්‍රගෙන් ප්‍රකාශ සටහන්කර ගත්තේය. ඉදිරියේදී ඔවුන් දෙදෙනාට චීන අසූචි පොහොර සිද්ධිය සම්බන්ධයෙන් වූ නඩුකරයට මුහුණ දීමට සිදුවනු නියතය.

ගානේ එළියට එමින් ඇත්තේ වැඩි කල් යන්නට මත්තෙන් පාස්කු ඉරුදින එල්ලවූ ප්‍රහාර මාලාවේ මහ මොළකරු ඇතුළු කුමන්ත්‍රණකරුවන් රට හමුවේ අනාවරණ වනු ඇතැයි විශ්වාසයන්ද සමගිනි.

පාස්කු ඉරුදින ප්‍රහාර මාලාවේ චරිතයක් වන සාරා ජෙස්මින් මියගිය බවට වූ ඩී.එන්.ඒ. වාර්තාවද ලෝක බොරුවක් බවට දැන් පත්ව හමාරය. එම ඩී.එන්.ඒ. වාර්තාව එළියට ආ හැටි ගැනද ඇත්තේ සුවිශේෂ විමර්ශනයකි. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩි කල් යන්නට මත්තෙන් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේද කිහිප දෙනෙක් නීතිය හමුවට ගෙන එනු ඇත. ඒ සාරා මැරුණු බවට වූ ඩී.එන්.ඒ. වාර්තාව සම්බන්ධයෙන් මේ වනවිට ප්‍රශ්නගතව ඇති බැවිනි. අඩුම තරමින් රස පරීක්ෂක කාර්යාලයේ එම ඩී.එන්.ඒ. වාර්තාවට පදනම් වූ ජෛව සාම්පල පවා සොයාගන්නට නැත. ඒ සෙසු සාම්පල සියල්ලක්ම ඒ විදිහටම තිබෙන පසුබිමකය.

පාස්කු ඉරිදා එල්ලවූ ත්‍රස්ත ප්‍රහාර මාලාවෙන් අනතුරුව සයින්දු මරුදූහි නිවසකදී සිදුවූ පිපුරුම්වලින් මියගිය අය අතර සාරා ජෙස්මින් නොමැති බව ඩී.එන්.ඒ වාර්තා දෙකකින්ම තහවුරු වී තිබියදීත් මළ සිරුරු ගොඩගෙන තුන්වැනි ඩී.එන්.ඒ. පරීක්ෂණයක් කළ යුතු බවට දැඩි මතයක් ඉදිරිපත් කළේ යැයි කියැවෙන්නේ සුරේෂ් සලේය. ඒ ගෝඨාභය ආණ්ඩුවේ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා ලෙස සිටි වකවානුවේදීය. ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලදී එවක සිටි පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතාට ඔහු මෙන්ම එවකට සිටි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තෙවැනි ඩී.එන්.ඒ. පරීක්ෂණයක් සිදුකරන ලෙසට කර තිබුණේ දැඩි බලපෑමකි.

මේ වනවිට පොලිස් සේවයෙන් විශ්‍රාම ගොස් සිටින සී.ඩී. වික්‍රමරත්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හමුවේ ඒ සියල්ලක්ම කියා ඇති බව සඳහන්ය. ඒ කටට එන පළියට නොව, පොලිස් සේවයේ නිරතව සිටියදී ඔහු ඒ සම්බන්ධනේ තැබූ සටහන්ද සමගිනි. ආරක්ෂක මණ්ඩලයේදී ඒ සම්බන්ධයෙන් කළ බලපෑම් ගැන පවා ඔහු සටහන් තබා තිබී ඇත. ඒ දේවල් අද ප්‍රබල සාක්ෂි බවට පත්ව ඇත්තේ පාස්කු ඉරුදින එල්ලවූ ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් වූ විමර්ශන යට ගැසීමටත් නොමග යැවීමටත් උත්සාහ දැරුවන්ට වැඩ වරදිමිනි. බොහෝ දෙනකුට හිරේ විලංගුවේ වැටෙන තරමට එම සටහන් බලපා ඇති බව සඳහන්ය.

පාස්කු ඉරුදින එල්ල වූ ප්‍රහාර මාලාව හා බැඳුණු මහමොළකරු හඹායමින් සිටින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒ සම්බන්ධයෙන් මුලින්ම කොටුකර ගන්නේ හිටපු බුද්ධි අංශ ප්‍රධානි සුරේෂ් සලේය. මෙතෙක් ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ඉහළම නිලධාරියා වන්නේද ඔහුය.

එවක සිටි පොලිස්පති පූජිත් ජයසුන්දර සහ ආරක්ෂක ලේකම්වරයාව සිටි හේමසිරි ප්‍රනාන්දුට එල්ලවී ඇත්තේ ප්‍රහාරය වළක්වා ගැනීමට නොහැකි වීමේ චෝදනා මිස ප්‍රහාරයට කුමන්ත්‍රණය කිරීමක් ගැන නොවේ. ඒ අනුව අලුත් විමර්ශන තත්ත්වයන්ට අනුව සුරේෂ් සලේගෙන් පසු තවත් පිරිසක් එක පෝලිමට නීතිය හමුවට ගෙන ඒමට නියමිතය. ඒ දේවල් සිදුවන්නේ පිළිවෙළකටය. ලැබෙන සාක්ෂි මතය. ගෝඨාභය රාජපක්ෂ මහතාට විදෙස් ගමන් තහනමක් පැනවීමට පියවර ගෙන ඇත්තේ ඒ අනුවය. ඒ මෙම විමර්ශනයේදී ගෝඨාභය රාජපක්ෂ ද වැදගත් චරිතයක් බවට පත්ව ඇති බැවිනි. ඒ ගැන ඉදිරියේදී හිටපු ජනපති ගෝඨාභය රාජපක්ෂගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රශ්න කරනු ඇත. ඒ සඳහා ඔහුව මෙරට තුළ රඳවා ගැනීම සඳහා විදෙස් ගමන් තහනමක් පැනවීමට කටයුතු කළ බව පැහැදිලිය. ඒ ඇතැම් විට මේ විමර්ශන අස්සේ ගෝඨාභය රාජපක්ෂ විදෙස්ගත වුවහොත් ඔහුගේ සහෝදරයා වන බැසිල් රාජපක්ෂ මෙන් අල්ලා ගැනීමට නොහැකි වනු ඇතැයි සැක කරමින් විය හැකිය.

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් හිටපු බුද්ධි අංශ ප්‍රධානී සලේ අත්අඩංගුවට ගෙන මේ කරන විමර්ශන සියල්ලක්ම පෙළගැසී ඇත්තේ හඹායන මහමොළකරු පස්සේය. මේ හැම දෙයකටම මගපෑදෙන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ශානි අබේසේකර ඇතුළු විමර්ශන කණ්ඩායමක් ප්‍රංශයට ගොස් ප්‍රබල සාක්ෂිකරුවකු මුණගැසීමත් සමගිනි. ඔහු වෙන කිසිවෙක් නොව, එල්.ටී.ටී.ඊ.යේ හිටපු සන්නද්ධ නායකයෙක් මෙන්ම නැගෙනහිර පළාතේ හිටපු මහඇමැති සිවනේෂ තුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලෙයාන්ගේ හිටපු ලේකම් අසාද් මවුලානාය.

මේ වනවිට රටින් පලාගොස් යුරෝපීය රටක දේශපාලන රැකවරණය ලබමින් සිටින ඔහුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හමුවේ ප්‍රකාශයක් ලබාදීමට ඔහු රැඳී සිටින රටේ සිට ප්‍රංශයට ගෙන ආවේ යැයි කියන්නේ පිල්ලෙයාන්ගේ කණ්ඩායම විසින් වෙඩිතබා මරාදැමූ දෙමළ සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ පුතෙකු විසිනි. මේ ගමන සංවිධාන වන්නේ ප්‍රංශයේ ලියෝන් නුවරදී ඉකුත් පෙබරවාරි අග පැවැති ජාත්‍යන්තර පොලිස් සමුළුවකටද සහභාගී වීමට ශානි ඇතුළු කණ්ඩායම යන අතරතුරදීය. පොලිස් සමුළුව පෙන්වා ශානි ඇතුළු පිරිසක් ප්‍රංශයට ගිය සැබෑ අරමුණ වූයේ අසාද් මවුලානා මුණගැසීමය.

පාස්කු ඉරුදින ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් මහමොළකරු සොයා කරනු ලබන පරීක්ෂණ උඩුයටිකුරු වන්නේ ඊත් සමගිනි. නැගෙනහිර පළාත් භාර පොලිස් ප්‍රධානියා ලෙස සේවයේ නිරතව සිටින පොලිස් විශේෂ කාර්ය බළකායේ හිටපු ප්‍රධානී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිහිඟු වරුණ ජයසුන්දර මහතා පවා මේ වනවිට අධිකරණයේ පිහිට පතා ඇත්තේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කෙරන විමර්ශනවල ප්‍රතිඵලයක් ලෙස ඔහුවද අත්අඩංගුවට ගැනීමේ අවදානමක් මතුවී ඇති බැවිනි. ඔහු අධිකරණයෙන් ඉල්ලා ඇත්තේ අත්අඩංගුවට පත්වීම වළක්වමින් නියෝගයක් නිකුත් කරන ලෙසය. ඒ

රුවන් වෙඩිවර්ධන



කොළඹ 05, තිඹිරිගස්යාය, ජයරත්න මාවත, අංක 22හි පිහිටි ශ්‍රී මීඩියා ඉන්ඩිපෙන්ඩන්ට් නෙට්වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම විසින්, මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර, අංක 102/176හි පිහිටි සයුර් ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේදී 2026 ජුනි 14 වැනි ඉරිදා මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.